# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2016 අංක 7 දරන ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2016 මැයි මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2016 ජුනි මස 03 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 40.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

**2016 අංක 7 දරන ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2016 මැයි මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 4/2016

**ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ සාමාජිකයකු බවට පත්වීමට ශ්‍රී ලංකාවට අවකාශ සලසනු පිණිස එම බැංකුව ස්ථාපිත කරමින් එළැඹි ගිවිසුමේ අත්සන්කරුවකු වන ශ්‍රී ලංකාව විසින් එකී ගිවිසුම අපරානුමත කිරීම හෝ පිළිගැනීම සඳහා බලය පැවරීමට සහ, ඊට සම්බන්ධ කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම පනත 2016 අංක 7 දරන ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුත්තේ ය.

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ස්ථාපිත කරමින් එළැඹි ගිවිසුම අපරානුමත කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම සඳහා බලය පැවරීම.

2. මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් -

(අ) ශ්‍රී ලංකාව අත්සන්කරුවකු වන (පිළිවෙලින් මේ පනතේ "ගිවිසුම" සහ "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව පිහිටුවීමේ ගිවිසුමේ ව්‍යවස්ථා අපරානුමත කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම; සහ

(ආ) ශ්‍රී ලංකාවේ ලිඛිත නීතිවලට අනුව සීමා කිරීමකින් තොරව, ශ්‍රී ලංකා රජය විසින් එකී ගිවිසුම අපරානුමත කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම පිළිබඳ සාධන පත්‍රයක් බැංකුවේ තැන්පත් කිරීම,

කළ යුතු ය.

2—PL 009908—2861 (2016/05)

ශ්‍රී ලංකාවේ දී බැංකුව සඳහා සලසාදෙනු ලබන තත්ත්වයන්, මුක්තීන්, වරප්‍රසාද සහ නිදහස් කිරීම්.

**3.** ගිවිසුමේ IX වන පරිච්ඡේදයේ විධිවිධාන ශ්‍රී ලංකාවේ නීතියක් වශයෙන් බලාත්මක විය යුතු අතර, ඒ අනුව, බැංකුවට ගිවිසුමේ IX වන පරිච්ඡේදයේ නිශ්චිතව දක්වා ඇති හෝ 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත හෝ වෙන යම් නීතියක් යටතේ ප්‍රදානය කරන ලද තත්ත්වයන්, මුක්තීන්, වරප්‍රසාද සහ නිදහස් කිරීම් තිබිය යුතු ය.

ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කිරීම.

**4.** මෙම ගිවිසුම යටතේ ශ්‍රී ලංකා රජය විසින් බැංකුවට ගෙවිය යුතු හෝ වරින් වර ගෙවිය යුතු වන්නා වූ හෝ සියලු ගෙවීම් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය.

රජයේ පොරොන්දු නෝට්ටු හෝ බැඳීම් නිකුත් කිරීම.

**5.** (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එසේ කිරීම අවශ්‍ය වේ යයි සලකනු ලබන්නේ නම්, ගිවිසුමේ 6 වන ව්‍යවස්ථාවේ 5(ආ) ඡේදය යටතේ වාරික ගෙවීමේ කාර්යය සඳහා ගිවිසුමේ 6 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ මුදල් ඒකකය වෙනුවට ඉල්ලූ විට සම මිලට බැංකුවේ ගිණුමට ගෙවිය යුතු කවර හෝ ගනුදෙනු කළ නොහැකි සහ පොළී නොදරන්නා වූ පොරොන්දු නෝට්ටු හෝ වෙනත් බැඳීම් අවශ්‍ය වේ යයි ඔහු විසින් සලකනු ලබන ආකෘතියෙන් සාදා බැංකුව වෙත නිකුත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) 4 වන වගන්තිය යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවියයුතු කවර හෝ මුදලක් සලස්වාදීමේ කාර්යය සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කවර හෝ ගනුදෙනු කළ නොහැකි සහ පොළී නොදරන්නා වූ පොරොන්දු නෝට්ටු හෝ බැඳීම් අවශ්‍ය වේ යයි ඔහු විසින් සලකනු ලබන ආකෘතියෙන් සාදා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කිරීම මගින් ණය ලබාගැනීම කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව මෙම (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සාදා නිකුත් කරනු ලබන කවර හෝ පොරොන්දු නෝට්ටු හෝ බැඳීම් පිළිගෙන දරා සිටීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

(4) මෙම වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සාදා නිකුත් කරනු ලබන යම් පොරොන්දු නෝට්ටු හෝ බැඳීම් නිදහස් කිරීමට අවශ්‍ය යම් මුදල් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**6.** ගිවිසුම යටතේ බැංකුවෙන් ශ්‍රී ලංකා රජය විසින් හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බැංකුවෙන් ලද සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු අතර එසේ ලැබෙන මුදල් ප්‍රාග්ධන අරමුදල් නියෝජනය වන්නේ නම් කවර හෝ ලිඛිත නීතියක් යටතේ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මේ පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු හෝ වෙනත් බැඳීම් නිදහස් කිරීම සඳහා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වරින් වර යොදාගත යුතු ය. ලැබීම්.

**7.** (1) ගිවිසුමේ ව්‍යවස්ථාවල අන්තර්ගත කවර හෝ විධිවිධාන බලාත්මක කිරීම සඳහා යුක්තිසහගතව අවශ්‍ය වේ යයි මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සලකනු ලබන කාරණා සඳහා ඔහු විසින් නියම සාදනු ලැබිය හැකි ය. නියම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක් ම *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකළ යම් නියමයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකිය යුතු ය.

(4) යම් නියමයක අනනුමතයේ දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

**8.** ගිවිසුම යටතේ සිය මුල්‍ය බැඳීම් හෝ වගකීම් සපුරාලීමට හෝ ඉටුකිරීමට ශ්‍රී ලංකා රජයට හැකිවනු පිණිස මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් යුක්ති සහගත ලෙස අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලැබිය හැකි පරිදි සියලු පියවරයන් ගැනීම සහ සියලු විධිවිධාන සැලැස්වීම කරනු ලැබිය හැකි ය. පොදු විධිවිධාන.

**9.** මේ පනතේ කාර්යය සඳහා - අර්ථ නිරූපණය.

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**10.** මෙම පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

[2 වන වගන්තිය]

**ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ගිවිසුමේ ව්‍යවස්ථාවලිය**

ආසියාවේ ආර්ථිකයන්හි ආර්ථික සහ සමාජීය සංවර්ධනය, අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීම සහ වර්ධිතය තිරසාරව පවත්වා ගැනීම සඳහා කලාපීය සහයෝගීතාවේ ඇති වැදගත්කම සහ විභව්‍ය මූල්‍ය අර්බුද සහ ගෝලීයකරණය හරහා බාහිර පාර්ශව වෙතින් එල්ලවන වෙනත් හදිසි කැළඹීම් හමුවේ යළිත් යථා තත්ත්වයට පත්වීම කෙරෙහි කලාපීය වශයෙන් දායකවීමේ වැදගත්කම **සැලකිල්ලට ගනිමින් ද;**

කලාපය තුළ අන්තර් සම්බන්ධන හැකියාව වර්ධනය කිරීම සහ කලාපීය ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම සඳහාත් එමගින් ආසියානු ජනතාව වෙනුවෙන් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ සමාජීය සංවර්ධනය තිරසරව පවත්වා ගැනීම සඳහාත් යටිතල පහසුකම් සංවර්ධනයේ ඇති වැදගත්කම **පිළිගනිමින් ද,** ගෝලීය ආර්ථික සචලතාව උදෙසා දායක **වෙමින් ද;**

පවත්නා බහු පාර්ශ්වික සංවර්ධන බැංකු සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) අතර හවුලක් මගින් ආසියාවේ යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් මූල්‍ය සැපයීමේ දිගු කාලීන අවශ්‍යතා වඩාත් ප්‍රමාණවත් ආකාරයෙන් සපුරාගත හැකි බව **අවබෝධකර ගනිමින් ද,**

මේ සඳහා ආසියාව තුළින් සහ ඉන් බැහැරව අත්‍යවශ්‍ය අතිරේක සම්පත් ඒකරාශි කර ගැනීමටත්, වෙන් වෙන් වශයෙන් ගත් කළ ආසියාවේ ආර්ථිකයන් මුහුණ දී සිටින මූල්‍ය දුෂ්කරතා ඉවත්කර ගැනීමටත්, ආසියාව තුළ ස්ථාවර සහ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම පිණිස පවත්නා බහු පාර්ශ්වික සංවර්ධන බැංකුවල කාර්යභාරය අනුපූරණය කිරීමටත් යටිතල පහසුකම් සංවර්ධනය කේන්ද්‍රකරගත් බහු පාර්ශ්වික මූල්‍ය ආයතනයක් ස්ථාපිත කිරීම ඉවහල් වන බව **ප්‍රත්‍යක්ෂකර ගනිමින් ද,**

පහත සඳහන් පරිදි ක්‍රියාත්මක විය යුතු බැංකුව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මෙම ගිවිසුමට අත්සන් තබනු ලබන රජය විසින් **එකඟවන ලදී:-**

# 2016 අංක 7 දරන ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු ගිවිසුම (අපරානුමත කිරීමේ) පනත

## 1 වන පරිච්ඡේදය

### අරමුණ, කර්තව්‍යයන් සහ සාමාජිකත්වය

**1 වන ව්‍යවස්ථාව - අරමුණ**

1. බැංකුවේ අරමුණ විය යුත්තේ: (i) තිරසාර ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීම, සශ්‍රීකත්වය ගොඩනැගීම සහ යටිතල පහසුකම් අංශයේ සහ වෙනත් ඵලදායි අංශවල ආයෝජනය කිරීම තුළින් ආසියාවේ යටිතල පහසුකම් සම්බන්ධකතාව වර්ධනය කිරීම; සහ (ii) වෙනත් බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය සංවර්ධන ආයතන සමඟ සමීප සහයෝගිතාවයෙන් යුතුව ක්‍රියාකිරීම මඟින් සංවර්ධන අභියෝග ජයගැනීම පිණිස කලාපීය සහයෝගිතාව සහ හවුල් සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම.

2. පාලක මණ්ඩලය විසින් අන්‍යාකාරයකින් තීරණය කරනු ලැබ ඇත්නම් මිස, මෙම ගිවිසුමේ "ආසියාව" සහ "කලාපය" යන පද යොදා ඇති කවර හෝ තැනෙක එම පදවලට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ආසියාව සහ ඕෂේනියාව වශයෙන් වර්ගීකරණය කරන ලද භූගෝලීය කලාපයන් සහ සංයුති ඇතුළත් විය යුතු ය.

**2 වන ව්‍යවස්ථාව - කර්තව්‍යයන්**

බැංකුව විසින් සිය අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කර්තව්‍ය සිදු කළ යුතු යː-

(i) සංවර්ධන කාර්යයන් සඳහා, විශේෂයෙන් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහ වෙනත් ඵලදායි අංශවල ආයෝජනය සඳහා කලාපය තුළ රාජ්‍ය සහ පෞද්ගලික ප්‍රාග්ධන අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම;

(ii) කලාපයේ ඌණ සංවර්ධිත සාමාජික රටවල අවශ්‍යතා පිළිබඳව විශේෂ සැලකිල්ලක් යොමු කරමින්, සමස්තයක් ලෙස කලාපයේ හරයාත්මක ආර්ථික වර්ධනය කෙරෙහි වඩාත් ඵලදායි අයුරින් දායක වන්නාවූ ව්‍යාපෘති සහ වැඩසටහන් ද ඇතුළුව කලාපීය සංවර්ධනය සඳහා මූල්‍ය සැපයීමට බැංකුව සතු සම්පත් උපයෝගීකර ගැනීම;

(iii) විශේෂයෙන් යටිතල පහසුකම් සහ වෙනත් ඵලදායි අංශවලින් කලාපීය ආර්ථික සංවර්ධනය උදෙසා දායක වන ව්‍යාපෘති, ව්‍යවසායන් සහ ක්‍රියාකාරකම් සඳහා පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම සහ පෞද්ගලික ප්‍රාග්ධනය ලබාගත නොහැකි අවස්ථාවන්හි දී සාධාරණ නියමයන් සහ කොන්දේසි මත පෞද්ගලික ආයෝජන සඳහා අතිරේක වශයෙන් සැපයීම; සහ

(iv) මෙකී කර්තව්‍යයන් වැඩි දියුණු කිරීම පිණිස වෙනත් ක්‍රියාකාරකම් ඉටු කිරීම සහ අනෙකුත් සේවාවන් සලසා දීම.

**3 වන ව්‍යවස්ථාව - සාමාජිකත්වය**

1. ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුවේ හෝ ආසියානු සංවර්ධන බැංකුවේ සාමාජිකයන් සඳහා බැංකුවේ සාමාජිකත්වය විවෘත විය යුතු යः-

(අ) 'අ' උපලේඛනයේ 'අ' වන කොටසේ ලැයිස්තු ගතකර ඇති සාමාජිකයන් සහ 1 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදයට අනුව ආසියානු කලාපයට ඇතුළත් කර ඇති අනෙකුත් සාමාජිකයන් කලාපීය සාමාජිකයන් විය යුතු ය. අනෙකුත් සියලුම සාමාජිකයන් කලාපීය නොවන සාමාජිකයන් විය යුතු ය;

(ආ) 57 වන ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති දින හෝ ඊට පෙර මෙම ගිවිසුමට අත්සන් තබා ඇති සහ 58 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවසන් දිනට පෙර සාමාජිකත්ව කොන්දේසි සියල්ල සපුරා ඇති, 'අ' උපලේඛනයේ ලැයිස්තු ගතකර ඇති සාමාජිකයන් ප්‍රාරම්භක සාමාජිකයන් විය යුතු ය.

2. 58 වන ව්‍යවස්ථාවට අනුව සාමාජිකයන් නොවන ප්‍රතිසංස්කරණය සහ සංවර්ධන සඳහා වූ අන්තර්ජාතික බැංකුවේ හෝ ආසියානු සංවර්ධන බැංකුවේ සාමාජිකයන් බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි මත, 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි පාලක මණ්ඩලයේ විශේෂ වූ බහුතර ඡන්දයකින් අන්තර් ජාතික සාමාජිකත්වය සඳහා ඇතුළත් කරගනු ලැබිය හැකි ය.

3. ස්වෛරී නොවන හෝ සිය ජාත්‍යන්තර සබඳතා මෙහෙයවීම පිළිබඳව වගකීම නොදරන ඉල්ලුම්කරුවකු විසින් බැංකුවේ සාමාජිකත්වය ලබාගැනීමට කරන ඉල්ලීම්, අදාළ ඉල්ලුම්පත්‍ර බැංකුවේ ජාත්‍යන්තර සබඳතා මෙහෙයවීම පිළිබඳව වගකීම දරන සාමාජිකයා මඟින් ඉදිරිපත් කළ යුතු හෝ ඒ සම්බන්ධයෙන් එකී සාමාජිකයාගේ එකඟත්වය මත ඉදිරිපත් කළ යුතු ය.

## II වන පරිච්ඡේදය

### ප්‍රාග්ධනය

**4 වන ව්‍යවස්ථාව - අනුමත ප්‍රාග්ධනය**

1. 5 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව දායකවීම සාමාජිකයන් සඳහා පමණක් විය යුතු එකක් එක්සත් ජනපද ඩොලර් 100,000 ($ 100,000)ක

නාමික අගයක් සහිත කොටස් මිලියනයකට ($1,000,000) විභාජනය කරන ලද බැංකුවේ අනුමත ප්‍රාග්ධන ස්කන්ධ, එක්සත් ජනපද ඩොලර් බිලියන සියයක් ($100,000,000,000) විය යුතු ය.

2. මුල් අනුමත ප්‍රාග්ධන ස්කන්ධය ගෙවා නිමි කොටස් සහ කැඳවියහැකි කොටස් වශයෙන් වර්ග කළ යුතු ය. ඩොලර් බිලියන විස්සක ($20,000,000,000) සමුච්චිත නාමික අගයකින් යුත් කොටස් ප්‍රමාණයක් ගෙවා නිමි කොටස් විය යුතු අතර, ඩොලර් බිලියන අසූවක ($80,000,000,000) සමුච්චිත නාමික අගයකින් යුත් කොටස් ප්‍රමාණයක් කැඳවියහැකි කොටස් විය යුතු ය.

3. ගෙවා නිමි කොටස් සහ කැඳවියහැකි කොටස් අතර සමානුපාතය ඇතුළුව යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසි යටතේ යම් අවස්ථාවන්හි දී 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි වැඩි බහුතර ඡන්දයකින් බැංකුවේ අනුමත ප්‍රාග්ධන ස්කන්ධය ඉහළ නැංවිය හැකි ය.

4. මෙම ගිවිසුමේ "ඩොලරය" යන පදය සහ "$" යන සංකේතය යොදා ඇති කවර හෝ තැනෙක එම පදය සහ සංකේතය ඇමරිකා එක්සත් ජනපදයේ ගෙවීම් සිදුකරන නිල විනිමය ඒකකය වශයෙන් තේරුම්ගත යුතු ය.

**5 වන ව්‍යවස්ථාව - කොටස් සඳහා දායකත්වය**

1. බැංකුවේ ප්‍රාග්ධන ස්කන්ධයේ කොටස් සඳහා සෑම සාමාජිකයෙක්ම දායකවිය යුතු ය. එක් එක් සාමාජිකයෙකුගේ මුල් අනුමත ප්‍රාග්ධන කොටස් දායකත්වය ගෙවානිමි කොටස් සහ කැඳවියහැකි කොටස් දෙක (2) ට අට (8) යන අනුපාතයට විය යුතු ය. 58 වන ව්‍යවස්ථාවට අනුව සාමාජිකයන් වන රාජ්‍යයන්ට දායක වීම සඳහා ලබා දී ඇති ආරම්භක කොටස් සංඛ්‍යාව 'අ' උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු ය.

2. 3 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදයට අනුව සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන රාජ්‍යයන් විසින් දායක වියයුතු ආරම්භක කොටස් සංඛ්‍යාව පාලක මණ්ඩලය විසින් නිශ්චය කළ යුතු ය. එසේ වුව ද, 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි පාලක මණ්ඩලය විසින් වැඩි බහුතර ඡන්දයෙන් අන්‍යාකාරයෙන් එකඟවී ඇත්නම් මිස, එකී කොටස් සංඛ්‍යාව නිශ්චය කිරීමේ දී කලාපීය සාමාජිකයන් විසින් දායකත්වය දරන ප්‍රාග්ධන කොටස් ප්‍රමාණය සමස්ත ප්‍රාග්ධන කොටස් ප්‍රමාණයෙන් සියයට හැත්තෑපහකට (75) වඩා අඩු වීමක් සිදු නොවිය යුතු ය.

3. යම් සාමාජිකයෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, පාලක මණ්ඩලය විසින් 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි වැඩි බහුතර ඡන්දයෙන් නිශ්චය කරනු ලබන යම් නියමයන් සහ කොන්දේසි මත එකී සාමාජිකයාගේ කොටස් දායකත්වය වැඩි කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, , 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි පාලක මණ්ඩලය විසින් වැඩි බහුතර ඡන්දයෙන් අන්‍යාකාරයෙන් එකඟවී ඇත්නම් මිස, එකී කවර හෝ සාමාජිකයකුගේ කොටස් දායකත්වය වැඩි කිරීම මඟින් කලාපීය සාමාජිකයන් විසින් දායකත්වය දරන ප්‍රාග්ධන කොටස් ප්‍රමාණය සමස්ත කොටස් ප්‍රමාණයෙන් සියයට හැත්තෑපහකට (75) වඩා අඩුවීමක් සිදු නොවිය යුතු ය.

4. පාලක මණ්ඩලය විසින් වර්ෂ පහකට (5) නොවැඩි කාල පරිච්ඡේදයක් තුළ බැංකුවේ ප්‍රාග්ධන ස්කන්ධය සමාලෝචනය කරනු ලැබිය යුතු ය. අනුමත ප්‍රාග්ධන ස්කන්ධය ඉහළ දැමීමක දී, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි මත, අදාළ ඉහළ දැමීමට පෙරාතුවම දැරූ සමස්ත ප්‍රාග්ධන ස්කන්ධයේ දායකත්ව අනුපාතිකයට සමාන අනුපාතිකයට එසේ ඉහළ දමනු ලබන ස්කන්ධ ප්‍රමාණයට දායක වීමට සෑම සාමාජිකයකුටම සාධාරණ අවස්ථාවක් හිමි විය යුතු ය. ඉහළ දමනු ලබන ප්‍රාග්ධන ස්කන්ධයේ කවර හෝ කොටසකට දායක වීම කිසිදු සාමාජිකයකු හට අනිවාර්ය නොවිය යුතු ය.

**6 වන ව්‍යවස්ථාව - දායක මුදල් ගෙවීම**

1. 58 වන ව්‍යවස්ථාවට අනුව සාමාජිකයකු වන මෙම ගිවිසුමේ සෑම අත්සන්කරුවකුම විසින් බැංකුවේ ගෙවානිමි ප්‍රාග්ධන ස්කන්ධය සඳහා ආරම්භකව දායක වන මුදල, මෙම ව්‍යවස්ථාවේ 5 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී මුදලින් සියයට විස්සක (20) වටිනාකමින් යුත් වාරික පහකින් (5) විය යුතු ය. එක් එක් සාමාජිකයෙකු විසින් සිය මුල් වාරිකය මෙම ගිවිසුම බලාත්මක වන දින සිට දින තිහක් (30) ඇතුළත හෝ 58 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයට අනුව එම සාමාජිකයා වෙනුවෙන් අපරානුමත කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ සාධනපත්‍රය බැංකුවේ තැන්පත් කරනු ලබන දින හෝ ඊට පෙර යන අවස්ථා දෙකෙන් කවර හෝ පසුව සිදුවන අවස්ථාවේ දී ගෙවිය යුතු ය. මෙම ගිවිසුම බලාත්මක වන දින සිට වර්ෂයක කාලයකට පසුව දෙවන වාරිකය ගෙවීමට නියමිත වන අතර, ඉතිරි වාරික තුන (3) පෙර වාරිකය ගෙවීමට නියමිත දින සිට වර්ෂයක කාලයකට පසුව අනුක්‍රමික ව ගෙවිය යුතු ය.

2. මුල් ගෙවා නිමි ප්‍රාග්ධන ස්කන්ධය සඳහා ආරම්භක දායකත්ව ගෙවීමේ දී එක් එක් වාරික, මෙම ව්‍යවස්ථාවේ 5 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් මිස, ඩොලර් වලින් හෝ වෙනත් පරිවර්තනය කළහැකි ව්‍යවහාර මුදලින් ගෙවිය යුතු ය. එකී ගෙවීම් ඕනෑම අවස්ථාවක

බැංකුව විසින් ඩොලර්වලට පරිවර්තනය කරනු ලැබිය හැකි ය. එකී ගෙවා නිමි සහ ආශ්‍රිත කැඳවිය හැකි කොටස් සඳහා ගෙවීමට ඇති එහෙත් ගෙවා නැති මුදල් සම්පූර්ණයෙන් බැංකුවට ලැබෙන තෙක් එම කොටස් සම්බන්ධයෙන් අත්කරගත් ඡන්දය දීමේ අයිතිය ඇතුළු සියලුම අයිතිවාසිකම් බැංකුව විසින් අත්හිටවිය යුතු ය.

3. බැංකුවේ කැඳවිය හැකි ප්‍රාග්ධන ස්කන්ධ සඳහා දායක මුදල් ගෙවීම සිය බැරකම් පියවා ගැනීමට බැංකුවට අවශ්‍යවන විට පමණක් කැඳවීමට යටත් විය යුතු ය. එසේ කැඳවනු ලබන අවස්ථාවක දී, ඩොලර්වලින් හෝ අදාළ කැඳවීම සිදුකළ කාර්යය සඳහා බැංකුවේ බැඳීම් ඉටුකිරීමට අවශ්‍ය ව්‍යවහාර මුදලින් යන විකල්ප දෙකෙන් එකකින් සාමාජිකයා විසින් අදාළ ගෙවීම් සිදු කළ හැකි ය. නොගෙවූ දායක මුදල් සඳහා කැඳවීම සමස්ත කැඳවිය හැකි කොටස් ප්‍රමාණයට ප්‍රතිශතයෙන් ඒකාකාර විය යුතු ය.

4. මෙම ව්‍යවස්ථාව යටතේ කවර හෝ ගෙවීමක් කරනු ලබන ස්ථානය බැංකුව විසින් නිශ්චය කළ යුතු ය. එසේ වුව ද, පාලක මණ්ඩලයේ සමාරම්භක රැස්වීම පවත්වනු ලබන තෙක්, මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් පළමු වාරිකය බැංකුවේ භාරකරු වශයෙන් මහජන චීන සමූහාණ්ඩුවේ රජය වෙත ගෙවනු ලැබිය යුතු ය.

5. මෙම ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ඌණ සංවර්ධිත රටක් වශයෙන් සැලකෙන සාමාජිකයෙකු විසින් මෙම ව්‍යවස්ථාවේ 1 වන සහ 2 වන ඡේද යටතේ ගෙවනු ලැබිය යුතු සිය දායක මුදල් විකල්පයක් වශයෙන් -

(අ) ගෙවිය යුතු මුළු මුදලින් සියයට දහයක (10) ප්‍රතිශතයකට සමාන වූ වාරික දහයක් (10) දක්වා වූ වාරික සංඛ්‍යාවකින් මුළුමණින් ඩොලර්වලින් හෝ වෙනත් පරිවර්තනය කළ හැකි ව්‍යවහාර මුදලින් ගෙවීම, පළමු සහ දෙවන වාරික 1 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි අදාළ කාල වකවානු තුළ ගෙවිය යුතු අතර තෙවැනි වාරිකයේ සිට දහවන වාරිකය දක්වා මෙම ගිවිසුම බලාත්මක වන දිනයේ දෙවන සහ තදනන්තර සංවත්සර දිනවල දී ගෙවිය යුතු ය; හෝ

(ආ) මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය විධිවිධාන සලස්වා ඇති පරිදි වාරික පිළිබඳව වූ උපලේඛනය අනුගමනය කරමින් වාරිකයෙන් කොටසක් ඩොලර්වලින් හෝ වෙනත් පරිවර්තනය කළ හැකි ව්‍යවහාර මුදලින් සහ වාරිකයේ වටිනාකමින් සියයට පනහක් (50) දක්වා වන කොටසක් සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවීම. මෙම (ආ) අනුඡේදය යටතේ ගෙවීම් කිරීමේ දී පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු යː-

(i) මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය යටතේ සාමාජික මුදල් ගෙවනු ලබන අවස්ථාවේ දී තම ව්‍යවහාර මුදලින්

ගෙවනු ලබන ගෙවීම් කොටස පිළිබඳව සාමාජිකයා විසින් බැංකුවට උපදෙස් ලබා දිය යුතු ය;

(ii) මෙම 5 වන ඡේදය යටතේ සාමාජිකයෙකු විසින් තම ව්‍යවහාර මුදලින් කරනු ලබන සෑම ගෙවීමක්ම ගෙවනු ලබන දායක මුදලේ අදාළ කොටසේ මුළු ඩොලර් වටිනාකමට සමාන වන ලෙස බැංකුව විසින් තීරණය කරනු ලබන වටිනාකමකින් යුක්ත විය යුතු ය. මේ යටතේ වන ආරම්භක ගෙවීම සාමාජිකයා විසින් යෝග්‍ය යයි සලකනු ලබන වටිනාකමකින් යුක්ත විය යුතු ය. එහෙත් එම ගෙවීම එහි මුළු ඩොලර් වටිනාකමට අනුගත වීම අවශ්‍ය යයි බැංකුව විසින් තීරණය කරනු ලැබිය යුතු පරිදි එකී ගෙවීම සිදුකළ දින සිට දින අනූවක් (90) ඇතුළත අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට යටත් විය යුතු ය;

(iii) සාමාජිකයාගේ ව්‍යවහාර මුදලේ විදේශ විනිමය හුවමාරු වටිනාකම සැලකිය යුතු මට්ටමකින් අවප්‍රමාණ වී ඇතැයි බැංකුව අදහස් කරන්නේ නම්, අදාළ සාමාජිකයා විසින් සිය දායකත්වය වෙනුවෙන් බැංකුව විසින් දරනු ලබන සියලු ව්‍යවහාර මුදල්වල වටිනාකම පවත්වාගැනීමට අවශ්‍ය වන්නාවූ අතිරේක මුදල් ප්‍රමාණයක් සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළත තම ව්‍යවහාර මුදලින් බැංකුවට ගෙවනු ලැබිය යුතු ය;

(iv) සාමාජිකයාගේ ව්‍යවහාර මුදලේ විදේශ විනිමය හුවමාරු වටිනාකම සැලකිය යුතු මට්ටමකින් අධිප්‍රමාණ වී ඇතැයි බැංකුව අදහස් කරන්නේ නම්, අදාළ සාමාජිකයාගේ දායකත්වය වෙනුවෙන් බැංකුව විසින් දරනු ලබන සියලු ව්‍යවහාර මුදල්වල වටිනාකම ගැලපීම සඳහා අවශ්‍ය වන්නාවූ අතිරේක ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් බැංකුව විසින් සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළත සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් සාමාජිකයාට ගෙවනු ලැබිය යුතු ය;

(v) (iii) වන අනුඡේදය යටතේ ගෙවීම් සම්බන්ධයෙන් වන සිය අයිතිවාසිකම් බැංකුව විසින් අත්හරිනු ලැබිය හැකි අතර (iv) වන අනුඡේදය යටතේ ගෙවීම් සම්බන්ධයෙන් වන සිය අයිතිවාසිකම් සාමාජිකයා විසින් අත්හරිනු ලැබිය හැකි ය.

6. මෙම ව්‍යවස්ථාවේ 5(ආ) අනුඡේදය යටතේ දායක මුදල් ගෙවීම් කරන සාමාජිකයෙකුගෙන් එම සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය

යුතු මුදල වෙනුවට එම සාමාජිකයාගේ රජය විසින් හෝ එම සාමාජිකයා විසින් නාමෝද්දිෂ්ට කරනු ලබන තැන්පතු දරන්නෙකු විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටු හෝ වෙනත් බැඳීම් බැංකුව විසින් පිළිගනු ලැබිය යුතු ය. එසේ වුව ද, එකී මුදල සිය මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා බැංකුවට අවශ්‍ය වන්නා වූ මුදලක් නොවිය යුතු ය. එකී නෝට්ටු හෝ බැඳීම්, ගනුදෙනු කළ නොහැකි, පොළී නොදරන්නා වූ සහ ඉල්ලූ විට සම වටිනාකමට බැංකුවට ගෙවිය යුතු නෝට්ටු හෝ බැඳීම් විය යුතු ය.

7 වන ව්‍යවස්ථාව - **කොටස් පිළිබඳ නියමයන්**

1. සාමාජිකයන් විසින් ආරම්භකව දායකත්වය ලබාගනු ලබන කොටස් සම මිලට නිකුත් කරනු ලැබිය යුතු ය. 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශේෂ බහුතර ඡන්දයකින් පාලක මණ්ඩලය විසින් විශේෂ අවස්ථානුගත තත්ත්වයන් යටතේ වෙනත් කොන්දේසි මත නිකුත් කරනු ලබන්නේ නම් මිස, අනෙකුත් කොටස් සම මිලට නිකුත් කරනු ලැබිය යුතු ය.

2. කොටස් කවර හෝ ආකාරයකින් ඔඩපනය කිරීම හෝ පිළිබැඳීම නොකළ යුතු වන අතර, එම කොටස් පැවරිය හැක්කේ බැංකුවට පමණක් විය යුතු ය.

3. කොටස් පිළිබඳ සාමාජිකයන්ගේ වගකීම සිය නිකුතු වටිනාකමින් නොගෙවූ කොටසට පමණක් සීමා විය යුතු ය.

4. කිසිදු සාමාජිකයෙකු සිය සාමාජිකත්වය හේතු කොට බැංකුවේ බැඳීම් සම්බන්ධයෙන් වගකීමට යටත් නොවිය යුතු ය.

8 වන ව්‍යවස්ථාව - **සාමාන්‍ය සම්පත්**

මෙම ගිවිසුමේ යොදා ඇති පද සම්බන්ධය අනුව බැංකුවේ "සාමාන්‍ය සම්පත්" යන යෙදුමට පහත සඳහන් සම්පත් ඇතුළත් විය යුතු යː-

(i) 5 වන ව්‍යවස්ථාවට අනුකූලව දායකවන ගෙවා නිමි සහ කැඳවිය හැකි කොටස් දෙවර්ගයම ඇතුළත් බැංකුවේ අනුදත් ප්‍රාග්ධන ස්කන්ධය;

(ii) 16 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදය මගින් පවරා දෙනු ලබන බලතල ප්‍රකාර බැංකුව විසින් රැස් කරනු ලබන, 6 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ දක්වා ඇති කැඳවීමේ බැඳීම අදාළ වන්නා වූ අරමුදල්;

(iii) ණය ආපසු ගෙවීම්වලින් හෝ මෙම ව්‍යවස්ථාවේ (i) වන සහ (ii) වන අනුඡේදවල දක්වා ඇති සම්පත් සම්බන්ධයෙන්

ඉදිරිපත් කරනු ලබන ඇපවලින් උපයා ගනු ලබන හෝ එවැනි සම්පත් මත කරනු ලබන 11 වන ව්‍යවස්ථාවේ 2(vi) වන අනුඡේදය යටතේ අනුමත කර ඇති ව්‍යාපාර වස්තු අගය මත වන ආයෝජන සහ වෙනත් වර්ගවල මූල්‍ය සැපයීම්වලින් උපයා ගනු ලබන අරමුදල්;

(iv) ඉහත කී අරමුදල් මත ප්‍රදානය කරනු ලබන ණයවලින් හෝ 6 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති කැඳවීමේ බැඳීම අදාළ වන්නා වූ ඇපවලින් උපයා ගනු ලබන අරමුදල්; සහ

(v) මෙම ගිවිසුමේ 17 වන ව්‍යවස්ථාවේ සඳහන් බැංකුවේ විශේෂ අරමුදල් සම්පත් ගණයට අයත් නොවන බැංකුවට ලැබෙන අන් කවර හෝ අරමුදල් හෝ ආදායම්.

III වන පරිච්ඡේදය

**බැංකුවේ මෙහෙයුම්**

**9 වන ව්‍යවස්ථාව - සම්පත් භාවිතය**

පිළිවෙලින් 1 වන සහ 2 වන ව්‍යවස්ථාවල දක්වා ඇති අරමුණු සහ කර්තව්‍යයන් සඳහා පමණක් බැංකුවේ සම්පත් සහ පහසුකම්, යහපත් බැංකුකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව, භාවිත කරගනු ලැබිය යුතු ය.

**10 වන ව්‍යවස්ථාව - සාමාන්‍ය සහ විශේෂ මෙහෙයුම්**

1. බැංකුවේ මෙහෙයුම් -

(i) 8 වන ව්‍යවස්ථාවේ සඳහන් බැංකුවේ සාමාන්‍ය සම්පත්වලින් මූල්‍යනය කරනු ලබන සාමාන්‍ය මෙහෙයුම්; සහ

(ii) 17 වන ව්‍යවස්ථාවේ සඳහන් බැංකුවේ විශේෂ අරමුදල් සම්පත්වලින් මූල්‍යනය කරනු ලබන විශේෂ මෙහෙයුම්,

යන මෙහෙයුම් දෙවර්ගයෙන් සමන්විත විය යුතු ය.

එකී මෙහෙයුම් දෙවර්ගය විසින්ම කිසියම් එක් ව්‍යාපෘතියක හෝ වැඩසටහනක මූලිකාංග සඳහා වෙන් වෙන් වශයෙන් මූල්‍යනය කරනු ලැබිය හැකි ය.

2. බැංකුවේ පොදු සම්පත් සහ විශේෂ අරමුදල් සම්පත් පූර්ණ වශයෙන් එකිනෙකින් වෙන් වෙන් ව සියලු කල්හි සියලු කාරණා සම්බන්ධයෙන්

දැරීම, භාවිත කිරීම, ආයෝජනය කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම කරනු ලැබිය යුතු ය. බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල සාමාන්‍ය මෙහෙයුම් සහ විශේෂ මෙහෙයුම් වෙන වෙන ම දැක්විය යුතු ය.

3. කවර හෝ අවස්ථාවක් යටතේ, බැංකුවේ විශේෂ අරමුදල් සම්පත් මුලින් භාවිතකර ගනු ලැබූ හෝ යෙද වූ විශේෂ මෙහෙයුම් හෝ වෙනත් ක්‍රියාකාරකම් මගින් උද්ගතවන අලාභ හෝ බැරකම් සම්බන්ධයෙන් බැංකුවේ සාමාන්‍ය සම්පත්වලින් දැරීම හෝ ඒවා නිදහස් කිරීම පිණිස භාවිතකර ගැනීම හෝ නොකළ යුතු ය.

4. සාමාන්‍ය මෙහෙයුම්වලට කෙළින්ම අදාළවන වියදම්, බැංකුවේ සාමාන්‍ය සම්පත්වලින් අය කර ගත යුතු ය. විශේෂ මෙහෙයුම්වලට කෙළින්ම අදාළවන වියදම්, බැංකුවේ විශේෂ අරමුදල් සම්පත්වලින් පියවාගත යුතු ය. අන් කවර හෝ වියදම් බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු පරිදි අයකර ගත යුතුය.

**11 වන ව්‍යවස්ථාව - ප්‍රතිලාභීන් සහ මෙහෙයුම් ක්‍රම**

1. (අ) බැංකුව විසින් එහි කවර හෝ සාමාජික රාජ්‍යයක් වෙත හෝ එහි නියෝජිතායතනයක් වෙත හෝ උපකරණත්වයක් හෝ දේශපාලනික උපශාඛාවක් වන්නාවූ කවර හෝ සාමාජික රාජ්‍යයක දේශසීමාව තුළ ක්‍රියාත්මක වන කවර හෝ ආස්ථිත්වයක් හෝ ව්‍යවසායක් වෙත මෙන්ම කලාපයේ ආර්ථික සංවර්ධනය පිළිබඳව සැලකිලිමත් වන ජාත්‍යන්තර හෝ කලාපීය නියෝජිතායතන හෝ ආස්ථිත්වයන් වෙත මූල්‍යන පහසුකම් බැංකුව විසින් සලසා දෙනු ලැබිය හැකි ය.

(ආ) 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයෙන් පාලක මණ්ඩලය විසින්: (i) අදාළ සහන බැංකුවේ කාර්යය ඉටු කිරීමට අදාළ වන ආකාරයෙන් සැලසුම්කර ඇති බවටත්, බැංකුවේ අරමුණු අතරට ගැනෙන බවටත්, බැංකුවේ සාමාජිකත්වයේ සුභසිද්ධිය පිණිස හේතුවන බවටත් තීරණය කරනු ලබන්නේ නම්; සහ (ii) මෙම ව්‍යවස්ථාවේ 2 වන ඡේදය යටතේ එවැනි ප්‍රතිලාභියකුට සහන ලබාදිය හැකි ආකාරය කුමක්දැයි තීරණය කරනු ලබන්නේ නම්; බැංකුව විසින් විශේෂ අවස්ථාවන් යටතේ, ඉහත (අ) අනුඡේදයේ සඳහන් නොවන ප්‍රතිලාභියකු වෙත ද සහන ලබාදිය හැකි ය.

2. බැංකුව විසින් සිය මෙහෙයුම් පහත සඳහන් කවර හෝ ආකාරයකින් පවත්වා ගනු ලැබිය හැකි යː-

(i) සෘජු ණය ලබාදීම, ඒ සඳහා සම මූල්‍යනය හෝ සම්බන්ධ වීම;

(ii) කවර හෝ ආයතනයක හෝ ව්‍යවසායක ව්‍යාපාර වස්තුවල අරමුදල් ආයෝජනය කිරීම;

(iii) ආර්ථික සංවර්ධනය සඳහා වන ණය මුදල් සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් වෙනුවෙන් හෝ ප්‍රාථමික හෝ ද්විතික බැඳුම්කරු වශයෙන් ඇපවීම;

(iv) විශේෂ අරමුදල් සම්පත් උපයෝජනය පිළිබඳව නිශ්චය කෙරෙන ගිවිසුම්වලට අනුකූලව එකී සම්පත් භාවිතය;

(v) 15 වන ව්‍යවස්ථාවට අනුව තාක්ෂණික සහාය ලබාදීම; හෝ

(vi) 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශේෂ බහුතර ඡන්දයෙන් පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ අන්‍යාකාර මූල්‍ය සහාය ලබාදීම.

**12 වන ව්‍යවස්ථාව - සාමාන්‍ය මෙහෙයුම් පිළිබඳ සීමා කිරීම්**

1. 11 වන ව්‍යවස්ථාවේ 2 (i), (ii), (iii) සහ (iv) අනුඡේද යටතේ සිය සාමාන්‍ය මෙහෙයුම් තුළ බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය, ව්‍යාපාර වස්තු ආයෝජන, ඇපකර සහ වෙනත් ආකාරයේ මූල්‍යනයන් මත අයවිය යුතු මුළු හිඟ මුදල වැඩි වීම බැංකුවේ සමස්ත අවිකල දායක ප්‍රාග්ධනය, සංචිත සහ බැංකුවේ සාමාන්‍ය සම්පත් තුළ ඇතුළත් කල රඳවාගත් ආදායම් ප්‍රමාණය ඉක්මවන්නේ නම්, කිසිදු අවස්ථාවක එකී හිඟ මුදල කවර හෝ ලෙසකින් වැඩි නොකළ යුතු ය. ඉහත වගන්තියේ කුමන විධිවිධානයක් අන්තර්ගත වුව ද, එය නොසලකා, 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයකින් පාලක මණ්ඩලය විසින් බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ ස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින්, කවර හෝ අවස්ථාවක මෙම ඡේදයේ සඳහන් සීමාව බැංකුවේ සමස්ත අවිකල දායක ප්‍රාග්ධනය, සංචිත සහ බැංකුවේ පොදු සම්පත් තුළ ඇතුළත් කළ රඳවාගත් ආදායම් ප්‍රමාණයෙන් 250%ක් දක්වා ඉහළ දමනු ලැබිය හැකි ය.

2. බැංකුවේ පිය වූ ව්‍යාපාර වස්තු ආයෝජන සඳහා දරනු ලබන මුදල කිසිදු අවස්ථාවක බැංකුවේ සමස්ත ගෙවා නිමි අවිකල දායක සහභාග ප්‍රාග්ධනය සහ පොදු සංචිත වලට අනුරූප මුදලක් නොඉක්ම විය යුතු ය.

**13 වන ව්‍යවස්ථාව - මෙහෙයුම් ප්‍රතිපත්ති**

පහත දක්වා ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුවේ මෙහෙයුම් පවත්වා ගත යුතු යː-

1. බැංකුවේ මෙහෙයුම් සම්බන්ධයෙන් යහපත් බැංකුකරණ ප්‍රතිපත්ති මඟින් බැංකුවට මග පෙන්වනු ලැබිය යුතු ය.

2. 15 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ව්‍යාපාර වස්තු ආයෝජනය සහ තාක්ෂණික සහයෝගිතාව සඳහා වන නිශ්චිත ව්‍යාපෘති සහ නිශ්චිත ආයෝජන වැඩසටහන් මූල්‍යනය කිරීම පිණිස බැංකුවේ මෙහෙයුම් මඟින් ප්‍රතිපත්තිමය වශයෙන් විධිවිධාන සැලැස්විය යුතු ය.

3. සාමාජික රාජ්‍යයක් විරුද්ධ වන්නේ නම් බැංකුව විසින් එම සාමාජික රාජ්‍යයේ දේශසීමාව ඇතුළත කිසිදු කාර්යයක් සඳහා මූල්‍යන පහසුකම් ලබා නොදිය යුතු ය.

4. සීමා කිරීම්වලින් තොරව, පාරිසරික සහ සමාජීය බලපෑම් සඳහා ගත යුතු විසඳුම් ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රතිපත්ති ඇතුළුව බැංකුවේ එක් එක් මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිපත්ති සමඟ එහි මෙහෙයුම් අනනුකූල නොවන බවට බැංකුව වග බලා ගත යුතු ය.

5. මූල්‍යනය සඳහා වන ඉල්ලීමක් සලකා බැලීමේ දී, සියලු කාර්යෝචිත සාධක සැලකිල්ලට ගෙන, ප්‍රතිලාභියා සම්බන්ධයෙන් යුක්ති සහගත වන බවට බැංකුව සලකන නියමයන් සහ කොන්දේසි මත වෙනත් ආයතනයකින් මූල්‍යන හෝ වෙනත් පහසුකමක් ලබාගැනීමට ප්‍රතිලාභියා සතු හැකියාව පිළිබඳව බැංකුව විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

6. මූල්‍යන පහසුකමක් ලබාදීමේ දී හෝ ඒ සඳහා ඇප ලබාදීමේ දී, ප්‍රතිලාභියා සහ ඇපකරුවකු සිටී නම්, මූල්‍යන ගිවිසුම යටතේ සිය බැඳීම් ඉටු කිරීමට එම ඇපකරු සහ ප්‍රතිලාභියා සමත් වන්නේ දැයි යන කාරණය පිළිබඳව බැංකුව විසින් නිසි අවධානයක් යොමු කළ යුතු ය.

7. මූල්‍යන පහසුකමක් ලබාදීමේ දී හෝ ඒ සඳහා ඇප ලබාදීමේ දී, පොළී අනුපාතය සහ වෙනත් ගාස්තු සහ මුල් ණය මුදල ආපසු ගෙවීමේ කාලය පිළිබඳ උපලේඛනය බැංකුවේ මතයට අනුව අදාළ මූල්‍යන පහසුකමට සහ බැංකුවට දැරීමට සිදුවන අවදානමට සරිලන පරිදි විය යුතු ය.

8. බැංකුවේ සාමාන්‍ය හෝ විශේෂ මෙහෙයුම් තුළ ලබාදෙනු ලබන කවර හෝ මූල්‍යන පහසුකමක ප්‍රතිෂ්ඨාව උපයෝගී කර ගනිමින් කවර හෝ රටකින් භාණ්ඩ හෝ සේවා ප්‍රසම්පාදනය කිරීම මත කිසිදු සීමාවක් බැංකුව විසින් නොපැනවිය යුතු ය.

9. බැංකුව විසින් ලබාදුන්, ඇප ලබාදුන් හෝ සහ සම්බන්ධ වූ කවර හෝ මූල්‍යන පහසුකමක ප්‍රතිෂ්ඨාව, ආර්ථිකය සහ කාර්යක්ෂමතාවය පිළිබඳව සැලකිල්ල යොමු කරමින් අදාළ මූල්‍යන පහසුකම ලබාදෙනු

ලැබූ කාර්ය සඳහා පමණක් උපයෝගී කරගනු ලබන බව තහවුරු කිරීමට බැංකුව විසින් අවශ්‍ය පියවර ගත යුතු ය.

10. බැංකුවේ සම්පත් සමානුපාතික නොවන ප්‍රමාණයන්ගෙන් කවර හෝ එක් රටක යහපත උදෙසා උපයෝගී කරගැනීම වළක්වාගැනීමේ අභිප්‍රේයතාව පිළිබඳව බැංකුව විසින් නිසි අවධානයක් යොමු කළ යුතු ය.

11. සිය ව්‍යාපාර වස්තු ආයෝජන තුළ සාධාරණ නානාංගීකරණයක් පවත්වා ගැනීමට බැංකුව අපේක්ෂා කළ යුතු ය. බැංකුව විසින් කවර හෝ ආස්ථිත්වයක හෝ ව්‍යවසායක සිදු කර ඇති කොටස් ආයෝජනය කරණකොට, එම ආස්ථිත්වයේ හෝ ව්‍යවසායේ කළමනාකාරිත්ව වගකීම බැංකුව විසින් භාර නොගත යුතු අතර බැංකුව විසින් සිදුකර ඇති ආයෝජන ආරක්ෂා කර ගැනීම අවශ්‍ය වන්නේ නම් මිස, අදාළ ආස්ථිත්වයේ හෝ ව්‍යවසායේ පාලන අයිතිවාසිකමක් අපේක්ෂා නොකළ යුතු ය.

14 වන ව්‍යවස්ථාව - මූල්‍යන නියම සහ කොන්දේසි

1. බැංකුව විසින් ලබාදුන් හෝ සහභාගී වූ හෝ ඇපවූ ණය සම්බන්ධයෙන්, 13 වන ව්‍යවස්ථාවේ දක්වන ලද මෙහෙයුම් ප්‍රතිපත්තිවලට අනුකූලව සහ මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධානයන්ට යටත්ව, එළැඹෙන ගිවිසුම මඟින් අදාළ ණය හෝ ඇපකරය පිළිබඳ නියම සහ කොන්දේසි පිහිටුවා ගත යුතු ය. එකී නියම සහ කොන්දේසි පිහිටුවා ගැනීමේ දී සිය ආදායමේ සහ මූල්‍ය තත්ත්වයේ සුරක්ෂිතභාවය පිළිබඳව බැංකුව පූර්ණ වශයෙන් සැලකිලිමත් විය යුතු ය.

2. ණය මුදල් හෝ ණය සඳහා ඇපකර ලබාගනු ලබන ප්‍රතිලාභියා බැංකුවේ සාමාජිකයකු නොවන විට, එසේ කිරීම යෝග්‍ය යැයි බැංකුව අදහස් කරන්නේ නම්, අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත දේශසීමාව අයත් සාමාජික රාජ්‍යය හෝ බැංකුවට පිළිගත හැකි එම සාමාජික රාජ්‍යයේ රජයේ නියෝජිතායතනයක් හෝ කවර හෝ උපකරණත්වයක් විසින් මුල් ණය මුදල ආපසු ගෙවීම සහ එම ණය මුදල මත පොලිය සහ වෙනත් ගාස්තු මෙහි නියමයන්ට අනුව, ගෙවනු ලබන බවට ඇපයක් ලබාදෙන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

3. යම් ව්‍යාපාර වස්තු ආයෝජනයක අගය පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති යටතේ අවසර ලබා දී ඇති අදාළ ආස්ථිත්වයේ හෝ ව්‍යවසායේ ව්‍යාපාර වස්තු ප්‍රාග්ධනයේ නියමිත ප්‍රතිශතය නොඉක්ම විය යුතු ය.

4. විනිමය අවදානම අවම කරන ප්‍රතිපත්තිවලට අනුකූලව සිය මෙහෙයුම් තුළ අදාළ රටේ ව්‍යවහාර මුදලින් බැංකුව විසින් මූල්‍යන පහසුකම් ලබා දිය හැකි ය.

**15 වන ව්‍යවස්ථාව - තාක්ෂණික සහයෝගය**

1. බැංකුව විසින් තාක්ෂණික උපදෙස් සහ සහායන් සහ බැංකුවේ අරමුණු ඉටු වන සහ එහි කර්තව්‍යයන් ඇතුළත ගැනෙන ඒ හා සමාන වෙනත් සහායන් සලසා දෙනු ලැබිය හැකි ය.

2. එවැනි සේවාවන් සලසා දීමේ දී දැරීමට සිදු වන වියදම් ප්‍රතිපූරණය කළ නොහැකි නම්, බැංකුව විසින් එම වියදම් එහි ආදායමෙන් පියවා ගත යුතු ය.

## IV වන පරිච්ඡේදය

### බැංකුවේ මුදල්

**16 වන ව්‍යවස්ථාව - පොදු බලතල**

මෙම ගිවිසුමේ අන් තැනෙක නිශ්චිතව දක්වා ඇති බලතලවලට අමතරව, පහත සඳහන් බලතල බැංකුව සතු විය යුතු යː-

1. අදාළ නෛතික විධිවිධානවලට අනුකූලව බැංකුව විසින් සාමාජික රාජ්‍යයන්හි හෝ වෙනත් රාජ්‍යයන්හි ණය ගැනීමෙන් හෝ වෙනත් ක්‍රමවලින් අරමුදල් රැස් කරනු ලැබිය හැකි ය.

2. බැංකුව විසින් නිකුත් කරන ලද හෝ ඇපවන ලද හෝ ආයෝජනය කරන ලද සුරැකුම්පත් මිල දී ගැනීම සහ අලෙවි කිරීම බැංකුව විසින් කරනු ලැබිය හැකි ය.

3. බැංකුව විසින් ආයෝජනය කරනු ලැබ ඇති සුරැකුම්පත් අලෙවි කිරීම පහසුකරවීම පිණිස බැංකුව විසින් එම සුරැකුම්පත් සඳහා ඇප විය හැකිය.

4. බැංකුවේ කාර්යය සමඟ සමපාත වන කාර්යයන් සඳහා කවර හෝ ආස්ථිත්වයක් හෝ ව්‍යවසායක් විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් සඳහා බැංකුව විසින් ප්‍රාරක්ෂණය කිරීම හෝ ප්‍රාරක්ෂණය කිරීම සඳහා සහභාගීවීම කරනු ලැබිය හැකි ය.

5. බැංකුවේ මෙහෙයුම් සඳහා අවශ්‍ය නොවන අරමුදල් බැංකුව විසින් ආයෝජනය කිරීම හෝ තැන්පත් කිරීම කරනු ලැබිය හැකි ය.

6. බැංකුව විසින් නිකුත් කරනු ලබන හෝ ඇපවන සෑම සුරැකුම්පතකම එහි මුහුණතෙහි එය කවර හෝ රජයක බැඳීමක් නොවන බව ප්‍රකටව පෙනෙන අයුරින් සටහන් කළ යුතු වුව ද එය යම් රජයක බැඳීමක් වන්නේ නම් ඒ බව එපරිද්දෙන් සටහන් කරනු ලැබිය යුතු ය.

7. බැංකුව විසින් වෙනත් පාර්ශව වෙනුවෙන් භාරය පිට දරා සිටින අරමුදල් ස්ථාපනය කිරීම සහ පරිපාලනය කිරීම කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇති භාර අරමුදල් රාමුවක් යටතේ බැංකුවේ අරමුණු සපුරාලන සහ කර්තව්‍යයන් තුළට ඇතුළත් වන පරිදි එවැනි භාර අරමුදල් සැලසුම් කරනු ලැබිය යුතු ය.

8. 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශේෂ බහුතර ඡන්දයක් මගින් පාලක මණ්ඩලයේ අනුමතය ඇතිව පමණක් බැංකුවේ අරමුණු සපුරාලන සහ බැංකුවේ කර්තව්‍යයන් තුළට ඇතුළත් වන පරිදි සැලසුම් කරනු ලැබ ඇති අතිරේක ආස්ථිත්වයන් බැංකුව විසින් ස්ථාපිත කරනු ලැබිය හැකි ය.

9. මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව බැංකුවේ අරමුණු සහ කර්තව්‍යයන් තවදුරටත් වර්ධනය කිරීම පිණිස අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි වෙනත් බලතල ක්‍රියාත්මක කිරීම සහ රීති සහ නියෝග පැනවීම කරනු ලැබිය හැකි ය.

17 වන ව්‍යවස්ථාව - **විශේෂ අරමුදල්**

1. බැංකුවේ අරමුණු සපුරාලන සහ කර්තව්‍යයන් තුළට ඇතුළත් වන පරිදි සැලසුම් කරනු ලැබ ඇති විශේෂ අරමුදල් බැංකුව විසින් පිළිගනු ලැබිය හැකි ය, එවැනි විශේෂ අරමුදල් බැංකුවේ සම්පත් විය යුතු ය. කවර හෝ විශේෂ අරමුදලක් පරිපාලනය කිරීමේ මුළු පිරිවැය අදාළ විශේෂ අරමුදලින් දැරිය යුතු ය.

2. බැංකුව විසින් පිළිගනු ලබන විශේෂ අරමුදල් බැංකුවේ අරමුණුවලට සහ කර්තව්‍යයන්ට සහ අදාළ විශේෂ අරමුදල පිළිබඳව වන ගිවිසුමට අනුකූල නියමයන් සහ කොන්දේසි මත භාවිත කරනු ලැබිය හැකි ය.

3. එක් එක් විශේෂ අරමුදල ස්ථාපිත කිරීම, පරිපාලනය කිරීම සහ භාවිත කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි විශේෂ රීති සහ නියෝග බැංකුව විසින් සම්මත කර ගත යුතු ය. බැංකුවේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වයන්ට ප්‍රකාශිතව අදාළ වන විධිවිධාන හැර මෙම ගිවිසුමේ සෙසු විධිවිධාන වලට එකී රීති සහ නියෝග අනුකූල විය යුතු ය.

4. "විශේෂ අරමුදල් සම්පත්" යන පදයෙන් කවර හෝ විශේෂ අරමුදලක සම්පත් අදහස් වන අතර ඊට -

(i) කවර හෝ විශේෂ අරමුදලක ඇතුළත් කිරීම සඳහා බැංකුව විසින් භාරගනු ලබන අරමුදල්;

(ii) යම් විශේෂ අරමුදලක් පාලනය වන බැංකුවේ රීති සහ නියෝග යටතේ එම අරමුදලින් මූල්‍යනය කරනු ලබන ණය හෝ ඇපකර

මගින් සහ කවර හෝ ව්‍යාපාර වස්තු ආයෝජනවල ප්‍රතිෂ්ඨාවන් මගින් එම විශේෂ අරමුදලට ලැබෙන අරමුදල්;

(iii) විශේෂ අරමුදල් සම්පත් ආයෝජනය කිරීම තුළින් උපයාගන්නා ආදායම්; සහ

(iv) කවර හෝ විශේෂ අරමුදලක බැහැරදීම සඳහා තබා ඇති අන් කවර හෝ සම්පත්,

ඇතුළත් වේ.

**18 වන ව්‍යවස්ථාව - ශුද්ධ ආදායම විභාජනය සහ බෙදාදීම**

1. බැංකුවේ ශුද්ධ ආදායමින් රඳවාගනු ලබන ඉපැයීම් සහ වෙනත් කාර්යයන් වෙනුවෙන් වන සංචිත සඳහා ප්‍රතිපාදන සලසාදීමෙන් අනතුරුව, කුමන කොටසක් වෙන් කළ යුතු ද යන්න සහ ඉතිරියක් වේ නම්, කුමන කොටසක් සාමාජිකයන් අතර බෙදාදිය යුතු ද යන්න පාලක මණ්ඩලය විසින් යටත් පිරිසෙයින් වාර්ෂිකව තීරණය කරනු ලැබිය යුතු ය. බැංකුවේ ශුද්ධ ආදායම වෙනත් කාර්යයන් සඳහා වෙන් කිරීම පිළිබඳ තීරණය 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයකින් ගනු ලැබිය යුතු ය.

2. එක් එක් සාමාජිකයා විසින් දරනු ලබන කොටස් සංඛ්‍යාවට සමානුපාතිකව ඉහත ඡේදයේ සඳහන් බෙදාදීම සිදු කළ යුතු අතර, පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ආකාරයෙන් සහ ව්‍යවහාර මුදලින් අදාළ ගෙවීම් සිදු කළ යුතු ය.

**19 වන ව්‍යවස්ථාව - ව්‍යවහාර මුදල්**

1. බැංකුව විසින් හෝ බැංකුවේ කවර හෝ ප්‍රතිලාභියකු විසින් ලැබීම්, දැරීම්, භාවිත කිරීම් හෝ පැවරීම් ඇතුළු කවර හෝ රටක දී කරනු ලබන ගෙවීම් සඳහා සාමාජිකයන් විසින් ව්‍යවහාර මුදල් ඒකක පිළිබඳව කිසිදු සීමා කිරීමක් නොකළ යුතු ය.

2. මෙම ගිවිසුම යටතේ යම් ව්‍යවහාර මුදලකට එරෙහිව වෙනත් යම් ව්‍යවහාර මුදලක් තක්සේරු කිරීම හෝ කවර හෝ ව්‍යවහාර මුදලක් පරිවර්තනය කරනු ලැබිය හැකි ද යන්න තීරණය කිරීම අවශ්‍ය වන අවස්ථාවල දී, එකී තක්සේරු කිරීම හෝ තීරණය කිරීම බැංකුව විසින් සිදුකළ යුතු ය.

**20 වන ව්‍යවස්ථාව - බැංකුවේ බැරකම් පියවා ගනු ලබන ක්‍රමය**

1. බැංකුවේ සාමාන්‍ය මෙහෙයුම් තුළ බැංකුව විසින් ප්‍රදානය කරනු ලැබූ, සහභාගී වූ හෝ ඇප වූ ණය ආපසු ගෙවීම අතපසු වූ හෝ පැහැරහැරීම සිදු වූ විට හෝ ව්‍යාපාර වස්තු ආයෝජන මත හෝ 11 වන ව්‍යවස්ථාවේ 2 (vi) වන අනුඡේදය යටතේ වෙනත් ආකාරයේ මූල්‍යනයන් මත අලාභ සිදු වූ විට, බැංකුව විසින් යෝග්‍ය යයි අදහස් කරන ක්‍රියාමාර්ග බැංකුව විසින් ගනු ලැබිය යුතු ය. ඇති විය හැකි අලාභ සඳහා සුදුසු ප්‍රතිපාදන බැංකුව විසින් පවත්වා ගනු ලැබිය යුතු ය.

2. බැංකුවේ සාමාන්‍ය මෙහෙයුම් මගින් උද්ගත වන අලාභ -

(i) පළමුව, ඉහත 1 වන ඡේදයේ සඳහන් ප්‍රතිපාදනවලින් ද;

(ii) දෙවනුව, ශුද්ධ ආදායමින් ද;

(iii) තෙවනුව, සංචිත සහ රඳවාගත් ඉපැයීම්වලින් ද;

(iv) සිව්වනුව, අවිකල ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් ද; සහ

(v) අවසාන වශයෙන්, 6 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ විධිවිධාන ප්‍රකාර කැඳවනු ලැබිය හැකි නොකැඳවූ දායක වූ කැඳවිය හැකි ප්‍රාග්ධනයෙන් සුදුසු මුදල් ප්‍රමාණයකින් ද,

අය කර ගනු ලැබිය යුතු ය.

## V වන පරිච්ඡේදය

**පාලනය**

**21 වන ව්‍යවස්ථාව - ව්‍යුහය**

පාලක මණ්ඩලයක්, අධ්‍යක්ෂ මණ්ඩලයක්, සභාපතිවරයෙක්, උප-සභාපතිවරුන් එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් නිලධරයන් සහ කාර්ය මණ්ඩලයක් බැංකුව සතුවිය යුතු ය.

**22 වන ව්‍යවස්ථාව - පාලක මණ්ඩලය : සංයුතිය**

1. සෑම සාමාජිකයකුම පාලක මණ්ඩලයේ නියෝජනය විය යුතු අතර එක් පාලකයෙක් සහ විකල්ප පාලකයෙක් බැගින් පත් කරනු ලැබිය යුතු ය. එකී එක් එක් පාලකයා සහ විකල්ප පාලකයා විසින් ඔහු පත්කරනු

ලබන සාමාජිකයාගේ අභිමතය පරිදි සේවය කරනු ලැබිය යුතු ය. කිසිදු විකල්ප පාලකයකුට ඔහුගේ ප්‍රධාන පාලකයා නොපැමිණ සිටී නම් හැර ඡන්දය පාවිච්චි කළ නොහැකි ය.

2. පාලක මණ්ඩලය විසින් එහි සෑම වාර්ෂික රැස්වීමකදී ම එක් පාලකයකු, පාලකයන් අතරෙන් සභාපතිවරයා වශයෙන් තෝරා පත්කර ගත යුතු අතර එම සභාපතිවරයා ඊළඟ සභාපතිවරයා තෝරා පත්කරගනු ලබන තෙක් එම ධුරය දැරිය යුතු ය.

3. පාලකයන් සහ විකල්ප පාලකයන් බැංකුවෙන් කිසිදු පාරිශ්‍රමිකයක් නොලබා සේවය කළ යුතු නමුත්, රැස්වීම් සඳහා සහභාගී වීමට ඔවුන් විසින් දරනු ලබන සාධාරණ වියදම් බැංකුව විසින් ගෙවනු ලැබිය හැකි ය.

**23 වන ව්‍යවස්ථාව - පාලක මණ්ඩලය : බලතල**

1. බැංකුව සතු සියලුම බලතල පාලක මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිය යුතු ය.

2. පහත සඳහන් බලතල හැර මණ්ඩලය සතු සෙසු කවර හෝ බලයක් හෝ සියලු බලතල පාලක මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා දෙනු ලැබිය හැකි යː-

(i) නව සාමාජිකයන් බඳවාගැනීම සහ එම බඳවාගැනීමට අදාළ කොන්දේසි තීරණය කිරීම;

(ii) බැංකුවේ අනුදත් ස්කන්ධ ප්‍රාග්ධනය වැඩි කිරීම හෝ අඩු කිරීම;

(iii) සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටු වීම;

(iv) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරනු ලබන මෙම ගිවිසුම අර්ථනිරූපණය කිරීම් හෝ එහි අදාළත්වය පිළිබඳව ඉදිරිපත් වන අභියාචන නිශ්චය කිරීම;

(v) බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ අධ්‍යක්ෂවරුන්ට සහ විකල්ප අධ්‍යක්ෂවරුන්ට ගෙවිය යුතු වියදම් සහ 25 වන ව්‍යවස්ථාවේ 6 වන ඡේදයට අනුව ගෙවිය යුතු පාරිශ්‍රමික කිසිවක් වේ නම්, ඒවා නිශ්චය කිරීම;

(vi) සභාපතිවරයා තෝරා පත් කර ගැනීම, ඔහු ධුර දැරීම අත්හිටුවීම, ධුරයෙන් ඉවත් කිරීම, ඔහුගේ පාරිශ්‍රමිකය සහ සෙසු සේවා කොන්දේසි නිශ්චය කිරීම;

(vii) විගණන වාර්තාව සමාලෝචනය කිරීමෙන් පසුව, පොදු ශේෂ පත්‍රය සහ බැංකුවේ ලාභ හා අලාභ ප්‍රකාශය අනුමත කිරීම;

(viii) බැංකුවේ සංචිත සහ ශුද්ධ ලාභ වෙන් කිරීම සහ බෙදාදීම පිළිබඳව නිශ්චය කිරීම;

(ix) මෙම ගිවිසුම සංශෝධනය කිරීම;

(x) බැංකුවේ මෙහෙයුම් අවසන් කිරීම සහ එහි වත්කම් බෙදාදීම පිළිබඳව තීරණය කිරීම; සහ

(xi) මෙම ගිවිසුමෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රකාශිතව පවරා දී ඇති සෙසු බලතල ක්‍රියාත්මක කිරීම.

3. මෙම ව්‍යවස්ථාවේ 2 වන ඡේදය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරාදෙනු ලබන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් අධිකාරී බලය ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලතලය පාලක මණ්ඩලය තමන් වෙත රඳවා තබා ගත යුතු ය.

**24 වන ව්‍යවස්ථාව - පාලක මණ්ඩලය : කාර්ය පටිපාටිය**

1. පාලක මණ්ඩලය විසින් වාර්ෂික රැස්වීමක් සහ පාලක මණ්ඩලය විසින් විධිවිධාන සලස්වනු ලබන පරිදි හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැඳවනු ලබන පරිදි වෙනත් යම් රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය. බැංකුවේ සාමාජිකයන් පස් (5) දෙනෙකු විසින් ඉල්ලා සිටිනු ලැබූ විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පාලක මණ්ඩලයේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

2. පාලක මණ්ඩලයේ කවර හෝ රැස්වීමක සනපූරණය පාලකවරුන් බහුතර සංඛ්‍යාවක් විය යුතු අතර එම බහුතර සංඛ්‍යාව සාමාජිකත්වයේ සමස්ත ඡන්ද බලයෙන් තුනෙන් දෙකකට වඩා නොඅඩු නියෝජනයක් විය යුතුය.

3. යම් නිශ්චිත ගැටලුවක් සම්බන්ධයෙන් රැස්වීමකින් තොරව පාලක මණ්ඩලයේ ඡන්දයක් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකිවනු පිණිස සහ යම් විශේෂ අවස්ථාගත තත්ත්වයන් යටතේ විද්‍යුත් ක්‍රමවේද මගින් පාලක මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස පාලක මණ්ඩලය විසින් නියෝග මගින් කාර්ය පටිපාටි ස්ථාපිත කරනු ලැබිය යුතු ය.

4. පාලක මණ්ඩලය විසින් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් වෙත බලය පැවරී ඇති ප්‍රමාණයට වෙනත් අතිරේක ආස්ථිත්වයන් ස්ථාපිත කරනු ලැබිය හැකි අතර, බැංකුවේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගැනීම පිණිස අවශ්‍ය විය හැකි හෝ යෝග්‍ය වන්නා වූ රීති සහ නියෝග පනවනු ලැබිය හැකි ය.

**25 වන ව්‍යවස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩලය : සංයුතිය**

1. අධ්‍යක්ෂ මණ්ඩලය, පාලක මණ්ඩලයේ සාමාජිකයන් නොවන සාමාජිකයන් දොළොස් (12) දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එම සාමාජිකයන් අතුරින්:—

(i) නව දෙනෙකු (9) කලාපීය සාමාජිකයන් නියෝජනය කරන පාලකයන් විසින් තෝරා පත් කර ගත යුතු ය; සහ

(ii) තුන් දෙනෙකු (3) කලාපීය නොවන සාමාජිකයන් නියෝජනය කරන පාලකයන් විසින් තෝරා පත් කර ගත යුතු ය.

අධ්‍යක්ෂවරුන් ආර්ථික සහ මූල්‍ය කටයුතු පිළිබඳව විශිෂ්ට කෞශල්‍යයකින් හෙබි තැනැත්තන් විය යුතු අතර 'ආ' උපලේඛනය අනුව තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂවරුන් විසින් තමන් තෝරා පත් කර ගන්නා ලද පාලකයන් සහ තමන්ට ඡන්දය ලබාදුන් පාලකයන් නියෝජනය කරන සාමාජිකයන් නියෝජනය කරනු ලැබිය යුතු ය.

2. පාලක මණ්ඩලය විසින් කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණය සහ සංයුතිය සමාලෝචනය කරනු ලැබිය යුතු අතර 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයෙන් සුදුසු පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණය අඩු හෝ වැඩි කිරීම සහ එහි සුදුසු පරිදි සංයුතිය ප්‍රතිශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

3. සෑම අධ්‍යක්ෂවරයකු විසින් ම තමන් නොමැති විට තමන් වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස පූර්ණ බලතල සහිත විකල්ප අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු ය. නියමිත සංඛ්‍යාවට වඩා වැඩි සාමාජික සංඛ්‍යාවක ඡන්දයෙන් තේරී පත් වන අධ්‍යක්ෂවරයකුට අතිරේක විකල්ප අධ්‍යක්ෂවරයකු පත් කර ගැනීමට හැකිවන පරිදි පාලක මණ්ඩලය විසින් රීති සම්මත කරනු ලැබිය යුතු ය.

4. අධ්‍යක්ෂවරු සහ විකල්ප අධ්‍යක්ෂවරු සාමාජික රාජ්‍යයන්හි පුරවැසියන් විය යුතු ය. අධ්‍යක්ෂවරු දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකම ජාතියකට අයත් විය නොහැකි අතර කවර හෝ විකල්ප අධ්‍යක්ෂවරු දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකම ජාතියකට අයත් තැනැත්තන් විය නොහැක. මණ්ඩලයේ රැස්වීම් සඳහා විකල්ප අධ්‍යක්ෂවරුන්ට සහභාගී විය හැකි නමුත්, ඡන්දය පාවිච්චි කළ හැක්කේ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් විකල්ප අධ්‍යක්ෂවරයා වැඩ බලන විට දී පමණක් විය යුතු ය.

5. අධ්‍යක්ෂවරුන් විසින් වර්ෂ දෙකක (02) කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත තෝරා පත් කර ගනු ලැබිය හැකි ය.

(අ) සිය අනුප්‍රාප්තිකයන් තෝරා පත් කරනු ලැබ ධුරයේ වැඩ භාරගනු ලබන තෙක් අධ්‍යක්ෂවරු සිය ධුරය දැරිය යුතු ය.

(ආ) අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය අවසන් වීමට දින එකසිය අසූවකට (180) වඩා වැඩි කාලයක් ඉතිරිව තිබිය දී එම ධුරය පුරප්පාඩු වුවහොත්, පුරප්පාඩු වූ ධුරය කලින් දැරූ අධ්‍යක්ෂවරයා තෝරා පත් කර ගනු ලැබූ පාලකයන් විසින් ධුරයේ ඉතිරිව ඇති කාලය සඳහා 'ආ' උපලේඛනයට අනුව වෙනත් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. එසේ තෝරා පත් කර ගැනීම සඳහා එකී පාලකයන් විසින් බහුතර ඡන්දය පාවිච්චි කිරීම අවශ්‍ය විය යුතු ය. අධ්‍යක්ෂවරයකු තෝරා පත් කරගනු ලැබූ පාලකයන් විසින් ධුර කාලය අවසන් වීමට දින එකසිය අසූවකට (180) වඩා අඩු කාලයක් ඉතිරිව තිබිය දී අධ්‍යක්ෂ ධුරය පුරප්පාඩු වුවහොත් ඒ සඳහා අනුප්‍රාප්තිකයකු ඒ පරිද්දෙන් තෝරා ගනු ලැබිය හැකි ය.

(ඇ) අධ්‍යක්ෂවරයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති විටක, කලින් සිටි අධ්‍යක්ෂවරයාගේ විකල්ප අධ්‍යක්ෂවරයා විසින් හිටපු අධ්‍යක්ෂවරයාගේ විකල්ප අධ්‍යක්ෂවරයකු පත්කිරීමේ බලතල හැර සෙසු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

6. පාලක මණ්ඩලය විසින් අන්‍යාකාරයෙන් තීරණය කරනු ලබන්නේ නම් මිස, අධ්‍යක්ෂවරු හෝ විකල්ප අධ්‍යක්ෂවරු බැංකුවෙන් පාරිශ්‍රමිකයක් නොලබා සේවය කළ යුතු ය. එහෙත්, රැස්වීම් සඳහා සහභාගීවීමේ දී සාධාරණව දැරීමට සිදුවන වියදම් බැංකුව විසින් ගෙවනු ලැබිය හැකි ය.

**26 වන ව්‍යවස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩලය : බලතල**

බැංකුවේ සාමාන්‍ය මෙහෙයුම් මෙහෙයවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර ඒ සඳහා මෙම ගිවිසුම මඟින් ප්‍රකාශිතව පවරා දී ඇති බලතලවලට අමතරව, විශේෂයෙන් පහත සඳහන් කාර්යයන්

සම්බන්ධයෙන්, පාලක මණ්ඩලය විසින් තමන් වෙත පවරා දෙනු ලබන සියලු බලතල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යः-

(i) පාලක මණ්ඩලයේ කාර්යයන් සකස් කිරීම;

(ii) බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ සාමාජිකත්වයේ මුළු ඡන්ද සංඛ්‍යාවෙන් හතරෙන් තුනකට නොඅඩු බහුතර ඡන්දයෙන් ප්‍රධාන මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳව සහ බැංකු ප්‍රතිපත්ති යටතේ සභාපතිවරයාට අධිකාරී බලය පවරාදීම පිළිබඳව තීරණය කිරීම;

(iii) 11 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදය යටතේ බැංකුවේ මෙහෙයුම්වලට අදාළ තීරණ ගැනීම සහ සාමාජිකත්වයේ මුළු ඡන්ද සංඛ්‍යාවෙන් හතරෙන් තුනකට නොඅඩු බහුතර ඡන්දයෙන් සභාපතිවරයාට ඒ සම්බන්ධයෙන් අධිකාරී බලය පවරාදීම පිළිබඳව තීරණය කිරීම;

(iv) බැංකුවේ කළමනාකරණය සහ මෙහෙයුම් නිතිපතා අධීක්ෂණය කිරීම සහ විනිවිදභාවය, විවෘතභාවය, ස්වාධීනත්වය සහ වගවීම ආදී මූලධර්මවලට අනුකූලව ප්‍රමාදදෝෂ වළක්වාගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම;

(v) බැංකුවේ ක්‍රමෝපාය, වාර්ෂික සැලැස්ම සහ අයවැය අනුමත කිරීම;

(vi) යෝග්‍ය යයි අදහස් කරනු ලබන පරිදි කමිටු පත් කිරීම; සහ

(vii) එක් එක් මූල්‍ය වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් අනුමතය පිණිස පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

**27 වන ව්‍යවස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩලය : කාර්ය පටිපාටි**

1. බැංකුවේ ව්‍යාපාරික කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍යවන පරිදි වර්ෂය පුරා වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතු ය. 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයකින් පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත්නම් මිස, අධ්‍යක්ෂ මණ්ඩලය නේවාසික නොවන පදනමකින් ක්‍රියාත්මක විය යුතු ය. සභාපතිවරයා හෝ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු (3) විසින් ඉල්ලා සිටින කවර හෝ අවස්ථාවක රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

2. අධ්‍යක්ෂ මණ්ඩලයේ කවර හෝ රැස්වීමක සනපූරණය පාලකවරුන් බහුතර සංඛ්‍යාවක් විය යුතු අතර එම බහුතර සංඛ්‍යාව සාමාජිකත්වයේ සමස්ත ඡන්ද බලයෙන් තුනෙන් දෙකකට වඩා නොඅඩු නියෝජනයක් විය යුතුය.

3. යම් සාමාජික රාජ්‍යයකට අයත් ජාතිකයකු අධ්‍යක්ෂ මණ්ඩලයේ නොමැති නම්, අදාළ සාමාජික රාජ්‍යයේ නියෝජිතයකුට ඡන්ද බලය හිමි වීමකින් තොරව, විශේෂයෙන් එම රාජ්‍යයට අදාළවන කරුණක් පිළිබඳව සලකා බලනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයේ කවර හෝ රැස්වීමකට සහභාගී වීමට හැකිවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියෝග සම්මත කරනු ලැබිය යුතු ය.

4. විද්‍යුත් ක්‍රමවේද භාවිතයෙන් රැස්වීම් පැවැත්වීමටත් රැස්වීමක් පැවැත්වීමකින් තොරව යම් කරුණක් පිළිබඳව ඡන්දය විමසීමටත් හැකිවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්ය පටිපාටි සකස් කළ යුතු ය.

**28 වන ව්‍යවස්ථාව - ඡන්දය ප්‍රකාශ කිරීම**

1. එක් එක් සාමාජිකයකු සතු සමස්ත ඡන්ද බලය එහි මූලික ඡන්ද සංඛ්‍යාවෙන්, කොටස් ඡන්ද සංඛ්‍යාවෙන් සහ ප්‍රාරම්භක සාමාජිකයකු වන්නේ නම් ප්‍රාරම්භක සාමාජික ඡන්ද සංඛ්‍යාවෙන් සමන්විත විය යුතු ය.

(i) යම් සාමාජිකයකු සතු මූලික ඡන්ද සංඛ්‍යාව සියලුම සාමාජිකයන්ගේ මූලික ඡන්ද සංඛ්‍යාව, කොටස් ඡන්ද සංඛ්‍යාව සහ ප්‍රාරම්භක සාමාජික ඡන්ද සංඛ්‍යාව යන සංඛ්‍යාවන්ගේ සමුච්චිත අගයෙන් සියයට දොළහක් (12) සියලුම සාමාජිකයන් අතර සම සමව බෙදා දීමෙන් එක් සාමාජිකයෙකුට හිමිවන ඡන්ද සංඛ්‍යාව විය යුතු ය.

(ii) යම් සාමාජිකයකු සතු කොටස් ඡන්ද සංඛ්‍යාව, එම සාමාජිකයා බැංකුවේ ස්කන්ධ ප්‍රාග්ධනයෙන් හිමිකර ගෙන සිටින කොටස් සංඛ්‍යාවට සමාන විය යුතු ය.

(iii) එක් ප්‍රාරම්භක සාමාජිකයකුට ප්‍රාරම්භක සාමාජික ඡන්ද හය සීයක් (600) වෙන්කර දෙනු ලැබිය යුතු ය.

6 වන ව්‍යවස්ථාව යටතේ ගෙවා නිමි කොටස් සම්බන්ධයෙන් වන සිය බැඳීම්වලට අදාළව ගෙවිය යුතු මුදලින් කවර හෝ කොටසක් ගෙවීමට යම් සාමාජිකයකු අපොහොසත් වන්නේ නම්, එකී ගෙවීමට අපොහොසත් වීම පවතින තාක් කල් එම සාමාජිකයා විසින් ගෙවිය යුතු මුදල සහ සාමාජිකයා දායකත්වය දරන ගෙවා නිමි කොටස්වල මුළු නාමික වටිනාකමින් නොගෙවූ කොටස අතර ප්‍රතිශතය මත එම සාමාජිකයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි කොටස් ඡන්ද සංඛ්‍යාව ප්‍රමාණානුකූලව අඩු කරනු ලැබිය යුතු ය.

2. පාලක මණ්ඩලය තුළ ඡන්ද ප්‍රකාශ කිරීමේ දී එක් එක් පාලකයා ඔහු නියෝජනය කරන සාමාජිකයාට හිමි ඡන්ද ප්‍රකාශ කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(i) මෙම ගිවිසුමේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා ඇත්නම් මිස, පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන සියලුම කාරණා සම්බන්ධයෙන් ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය;

(ii) පාලක මණ්ඩලයේ අති බහුතර ඡන්දය සඳහා, සාමාජිකයන්ගේ මුළු ඡන්ද බලයෙන් හතරෙන් තුනකට නොඅඩු නියෝජනයක් සහිත සමස්ත පාලකවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක බහුතර අනුමත ඡන්දයක් අවශ්‍ය විය යුතු ය.

(iii) පාලක මණ්ඩලයේ විශේෂ බහුතර ඡන්දය සඳහා, සාමාජිකයන්ගේ මුළු ඡන්ද බලයෙන් බහුතරයකට නොඅඩු නියෝජනයක් සහිත සමස්ත පාලකවරුන්ගේ සංඛ්‍යාවෙන් බහුතර අනුමත ඡන්දයක් අවශ්‍ය විය යුතු ය.

3. අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ඡන්දය ප්‍රකාශ කිරීමේ දී සෑම අධ්‍යක්ෂවරයකුම ඔහු තෝරා පත් කරගනු ලැබූ පාලකයන්ට හිමි ඡන්ද සංඛ්‍යාවට සහ මෙහි ආ උපලේඛනයට අනුව ඔහුට සිය ඡන්ද පවරා දෙනු ලැබූ පාලකයන්ට හිමි ඡන්ද සංඛ්‍යාවට හිමිකම් ලැබිය යුතු ය.

(i) එකකට වඩා වැඩි සාමාජික රාජ්‍ය සංඛ්‍යාවක ඡන්ද ප්‍රකාශ කිරීමට හිමිකම් ලබා ඇති අධ්‍යක්ෂවරයකු විසින්, එකී එක් එක් සාමාජික රාජ්‍යය වෙනුවෙන් වෙන වෙනම ඡන්දය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(ii) මෙම ගිවිසුමේ ප්‍රකාශිතවම අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන සියලු කාරණා සම්බන්ධයෙන් ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

**29 වන ව්‍යවස්ථාව - සභාපතිවරයා**

1. පාලක මණ්ඩලය විසින් 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයෙන් විවෘත, විනිවිදභාවයෙන් යුතු සහ කුසලතා පාදක කාර්ය පටිපාටියක් පදනම් කර ගනිමින් බැංකුවේ සභාපතිවරයා තෝරා පත් කරගනු ලැබිය යුතු ය. ඔහු කලාපීය සාමාජික රාජ්‍යයකට අයත් ජාතිකයකු විය යුතු ය. සභාපතිවරයා, සභාපතිධුරය දරනු ලබන තාක් කල් පාලකයකු හෝ අධ්‍යක්ෂවරයකු හෝ විකල්ප අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් නොවිය යුතු ය.

2. සභාපතිවරයාගේ ධුර කාලය වර්ෂ පහක් (5) විය යුතු ය. ඔහු එක් වතාවක් නැවත පත් කරනු ලැබිය හැකි ය. පාලක මණ්ඩලය විසින් 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලබන්නේ නම්, සභාපතිවරයාගේ ධුරය අත්හිටුවීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(අ) සභාපතිවරයාගේ ධුර කාලය අතරතුර කවර හෝ අවස්ථාවක දී කවර හෝ කරුණක් මත සභාපති ධුරය පුරප්පාඩු වුවහොත්, පාලක මණ්ඩලය විසින් තාවකාලික කාලයක් සඳහා වැඩ බලන සභාපතිවරයකු පත්කිරීම හෝ මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදයට අනුව නව සභාපතිවරයකු තෝරා පත්කිරීම කරනු ලැබිය හැකි ය.

3. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා බැංකුවේ සභාපතිවරයා විය යුතු අතර ඡන්දය සම වන අවස්ථාවල දී තීරක ඡන්දය ප්‍රකාශ කිරීම හැරුණුකොට ඔහුට ඡන්ද බලය හිමි නොවිය යුතු ය. පාලක මණ්ඩලයේ රැස්වීම් සඳහා ඔහුට සහභාගී විය හැකි නමුත් එහිදී ඡන්දය ප්‍රකාශ නොකළ යුතු ය.

4. බැංකුවේ සභාපතිවරයා බැංකුවේ නෛතික නියෝජිතයා විය යුතු ය. බැංකුවේ කාර්ය මණ්ඩල ප්‍රධානියා ද විය යුතු ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ විධානය යටතේ බැංකුවේ වත්මන් ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙනයා යුතු ය.

**30 වන ව්‍යවස්ථාව - බැංකුවේ නිලධරයන් සහ කාර්ය මණ්ඩලය**

1. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවෘත, විනිවිදභාවයෙන් යුතු සහ කුසලතා පදනමක් මත සහ බැංකුවේ සභාපතිවරයාගේ නිර්දේශය මත උප-සභාපතිවරුන් එක් අයෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි අදාළ කාලපරිච්ඡේදය සඳහා ධුරය දැරීම, බැංකුවේ පරිපාලනයට අදාළව බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍යයන් ඉටු කිරීම උපසභාපතිවරයකු විසින් කරනු ලැබිය යුතු ය. බැංකුවේ සභාපතිවරයා නොමැති විට හෝ අශක්නුතාවට පත් වූ විට උප-සභාපතිවරයකු විසින් බැංකුවේ සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍යයන් ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

2. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලබන නියෝගවලට අනුකූලව, ඉහත 1 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ප්‍රමාණයට උපසභාපතිවරුන් හැර බැංකුවේ නිලධරයන් සහ කාර්ය මණ්ඩල සංවිධානය, පත් කිරීම සහ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් බැංකුවේ සභාපතිවරයා වගකිව යුතු ය.

3. නිලධරයන් සහ කාර්ය මණ්ඩලය පත් කිරීමේ දී සහ උපසභාපතිවරුන් නිර්දේශ කිරීමේ දී කාර්යක්ෂමතාවේ සහ තාක්ෂණික කුසලතාවේ ඉහළතම ප්‍රමිතීන් ආරක්ෂාකර ගැනීමේ අතිශය වැදගත්කම සැලකිල්ලට ගැනීමට යටත්ව, හැකිතාක් පුළුල් කලාපීය භූගෝලීය පදනමක් මත තැනැත්තන් බඳවා ගැනීම කෙරෙහි බැංකුවේ සභාපතිවරයා විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

**31 වන ව්‍යවස්ථාව - බැංකුවේ ජාත්‍යන්තර ස්වභාවය**

1. බැංකුවේ අරමුණට හෝ කර්තව්‍යයන්ට කිසිදු ලෙසකින් අගතිදායක වන ඒවා සීමා කෙරෙන, අපක්‍රමණය කෙරෙන හෝ අන්‍යාකාරයෙන් වෙනස් කෙරෙන විශේෂ අරමුදල්, ණය හෝ සහයෝගයන් බැංකුව විසින් භාර නොගත යුතු ය.

2. බැංකුව, එහි සභාපතිවරයා, නිලධරයන් සහ කාර්ය මණ්ඩලය කවර හෝ සාමාජික රාජ්‍යයක දේශපාලනික කටයුතුවලට මැදිහත් නොවිය යුතු අතර තීරණ ගැනීමේ දී අදාළ සාමාජික රාජ්‍යයේ දේශපාලනික ස්වරූපය මගින් ඔවුන් කිසිදු බලපෑමකට ලක් නොවිය යුතු ය. ආර්ථික කරුණු සලකා බැලීම පමණක් තම තීරණ සඳහා අදාළ විය යුතු ය. බැංකුවේ අරමුණ සහ කර්තව්‍යයන් මුදුන්පත් කරගැනීම සහ ඉටු කිරීම පිණිස එකී සලකා බැලීම්වල වැදගත්කම අපක්ෂපාතීව මැනවින් කළ යුතු ය.

3. බැංකුවේ සභාපතිවරයා, නිලධරයන් සහ කාර්ය මණ්ඩලය විසින් සිය ධුරයන්හි රාජකාරි ඉටු කිරීමේ දී සිය රාජකාරි අන් කවර හෝ අධිකාරයකට නොව බැංකුව වෙනුවෙන් ඉටු කිරීමට බැඳී සිටිය යුතු ය. බැංකුවේ සෑම සාමාජිකයකු විසින් ම මෙම රාජකාරියේ ජාත්‍යන්තර ස්වභාවයට ගරු කළ යුතු අතර අදාළ රාජකාරි ඉටුකිරීමේ දී ඉහත කී නිලධරයන් කවරෙකුට හෝ බලපෑමක් කිරීමට කිසිදු ප්‍රයත්නයක් නොදැරිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

## පොදු විධිවිධාන

**32 වන ව්‍යවස්ථාව - බැංකුවේ කාර්යාල**

1. බැංකුවේ ප්‍රධාන කාර්යාලය මහජන චීන සමූහාණ්ඩුවේ බීජිං නුවර පිහිටු විය යුතු ය.

2. බැංකුව විසින් සිය නියෝජිතායතන හෝ කාර්යාල අනෙකුත් ස්ථානවල පිහිටුවනු ලැබිය හැකි ය.

**33 වන ව්‍යවස්ථාව - සංනිවේදන යොමු කිරීම; සුරක්ෂිතාගාර**

1. මෙම ගිවිසුම යටතේ උද්ගත වන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් එක් එක් සාමාජිකයා සමග බැංකුවට සංනිවේදනය කළ හැකි වනු පිණිස සෑම සාමාජිකයකු විසින්ම සුදුසු නිල ආස්ථිත්වයක් නම් කරනු ලැබිය යුතු ය.

2. සෑම සාමාජිකයකු විසින්ම බැංකුව විසින් දරනු ලබන තම විනිමය වත්කම් මෙන්ම බැංකුවේ අනෙකුත් වත්කම් තබාගැනීමට බැංකුවට හැකිවන පරිදි සුරක්ෂිතාගාරයක් වශයෙන් එම සාමාජිකයාගේ මහ බැංකුව

හෝ ඒ පිළිබඳව බැංකුව සමග එකඟවනු ලැබිය හැකි පරිදි වෙනත් ආයතනයක් හෝ නම් කරනු ලැබිය යුතු ය.

3. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු සුරක්ෂිතාගාරවල බැංකුව විසින් බැංකුවේ වත්කම් තබාගනු ලැබිය හැකි ය.

**34 වන ව්‍යවස්ථාව - වාර්තා සහ තොරතුරු**

1. බැංකුවේ මෙහෙයුම් භාෂාව ඉංග්‍රීසි භාෂාව විය යුතු අතර, බැංකුවේ සියලුම තීරණ සම්බන්ධයෙන් සහ 54 වන ව්‍යවස්ථාව යටතේ වූ අර්ථනිරූපණ සම්බන්ධයෙන් බැංකුව විසින් මෙම ගිවිසුමේ ඉංග්‍රීසි භාෂා පාඨය මත පිහිටා ක්‍රියාකළ යුතු ය.

2. සාමාජිකයන් විසින් බැංකුවේ කර්තව්‍යයන් ක්‍රියාවට නැංවීම පහසුකරවීම පිණිස බැංකුව විසින් යුක්ති සහගත අයුරින් ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් තොරතුරක් බැංකුවට ලබා දෙනු ලැබිය යුතු ය.

3. විගණනය කරන ලද බැංකුවේ ගිණුම් ප්‍රකාශය අන්තර්ගත එහි වාර්ෂික වාර්තාවක් බැංකුව විසින් එහි සාමාජිකයන් වෙත යැවිය යුතු අතර එම වාර්තාව පළ කරනු ලැබිය යුතු ය. බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් සහ එහි මෙහෙයුම්වල ප්‍රතිඵල දැක්වෙන ලාභ හා අලාභ ප්‍රකාශයක් සෑම කාර්තුවක දී ම බැංකුව විසින් එහි සාමාජිකයන් වෙත ලබා දිය යුතු ය.

4. බැංකුවේ මෙහෙයුම්වල විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම පිණිස තොරතුරු අනාවරණය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති බැංකුව විසින් පැනවිය යුතු ය. බැංකුව විසින් සිය අරමුණු සහ කර්තව්‍යයන් කරගෙන යාම සඳහා අවශ්‍ය වේ යැයි බැංකුව විසින් සලකනු ලබන එවැනි වාර්තා පළ කරනු ලැබිය හැකි ය.

**35 වන ව්‍යවස්ථාව - සාමාජිකයන් සහ ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගිතාව**

1. බැංකුවේ සියලු සාමාජිකයන් සමඟ සහ වෙනත් ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන සහ කලාපයේ හෝ බැංකුවේ මෙහෙයුම් ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය පිළිබඳව බලවත් සැලකිල්ලක් දක්වන ජාත්‍යන්තර සංවිධාන සමග සමීප සහයෝගීතාවෙන් යුතුව සහ මෙම ගිවිසුමේ නියමයන් ඇතුළත යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි ආකාරයෙන් බැංකුව ක්‍රියා කළ යුතු ය.

2. බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතය ඇතිව, මෙම ගිවිසුමට අනුකූල වන කාර්යයන් සඳහා වෙනත් සංවිධාන සමග ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

**36 වන ව්‍යවස්ථාව - සඳහන් කිරීම්**

1. අන්‍යාකාරයෙන් නියමකර ඇත්නම් මිස, මෙම ගිවිසුමේ ව්‍යවස්ථා සහ උපලේඛන යනුවෙන් වන සියලු සඳහන් කිරීම් මෙම ගිවිසුමේ ව්‍යවස්ථා සහ උපලේඛන පිළිබඳ සඳහන් කිරීම් විය යුතු ය.

2. මෙම ගිවිසුමේ යම් නිශ්චිත ස්ත්‍රී හෝ පුරුෂ භාවයක් පිළිබඳ වන සෑම සඳහන් කිරීමක් ම ස්ත්‍රී හෝ පුරුෂ යන භාවයක් අතුරෙන් කවර හෝ භාවයකට අදාළ විය යුතු ය.

## VII වන පරිච්ඡේදය

## සාමාජිකත්වයෙන් ඉවත් වීම සහ සාමාජිකත්වය අත්හිටුවීම

**37 වන ව්‍යවස්ථාව - සාමාජිකත්වයෙන් ඉවත් වීම.**

1. බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත නිවේදනයක් බාරදීම මඟින් කවර හෝ සාමාජිකයෙකුට ඕනෑම අවස්ථාවක බැංකුවේ සාමාජිකත්වයෙන් ඉවත් විය හැකි ය.

2. යම් සාමාජිකයකුගේ ඉවත් වීම සහ එම සාමාජිකයාගේ බැංකුවේ සාමාජිකත්වය අහෝසි වීම එකී නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති දින සිට ක්‍රියාත්මක විය යුතු වුව ද කිසිදු අවස්ථාවක එකී නිවේදනය බැංකුවට ලැබුනු දින සිට මාස හයකට (6) නොඅඩු කාලයකට පෙර සාමාජිකත්වයෙන් ඉවත් වීම හෝ සාමාජිකත්වය අහෝසි වීම බලාත්මක නොවිය යුතු ය. කෙසේ වුව ද, සාමාජිකත්වයෙන් ඉවත් වීම අවසන් වශයෙන් බලාත්මක වීමට පෙරාතුව කවර හෝ අවස්ථාවක අදාළ සාමාජිකයා විසින් බැංකුවේ සාමාජිකත්වයෙන් ඉවත් වීමේ සිය අභිප්‍රාය දැනුම්දීමේ නිවේදනය අවලංගු කිරීම බැංකුව වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය හැකි ය.

3. සාමාජිකත්වයෙන් ඉවත්වීමේ සිය නිවේදනය බැංකුවට භාරදෙනු ලබන දිනට සාමාජිකත්වයෙන් ඉවත්වන සාමාජිකයා බැංකුවට යටත්ව තිබූ සියලු ඍජු සහ අසම්භව්‍ය බැඳීම් සම්බන්ධයෙන් අදාළ සාමාජිකයා තවදුරටත් බැංකුවට යටත් විය යුතු ය. සාමාජිකත්වයෙන් ඉවත් වීම අවසන් වශයෙන් බලාත්මක වන්නේ නම්, සාමාජිකත්වයෙන් ඉවත් වීමේ නිවේදනය බැංකුවට ලැබුණු දිනයෙන් පසුව බැංකුවේ මෙහෙයුම් මඟින් උද්ගත වන බැඳීම් සම්බන්ධයෙන් එම සාමාජිකයා බැඳීමකට යටත් නොවිය යුතු ය.

**38 වන ව්‍යවස්ථාව - සාමාජිකත්වය අත්හිටුවීම**

1. බැංකුව කෙරෙහි වන සිය කවර හෝ බැඳීම් ඉටු කිරීමට යම් සාමාජිකයකු අපොහොසත් වේ නම්, පාලක මණ්ඩලය විසින් 28 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලින් සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයකින් එම සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබිය හැකි ය.

2. පාලක මණ්ඩලය විසින් 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයකින් එසේ සාමාජිකත්වය අත්හිටවනු ලැබූ සාමාජිකයකුගේ සාමාජිකත්වය නැවත යථා තත්ත්වයට පත්කරනු ලබන්නේ නම් මිස, එම සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටවනු ලැබූ දින සිට වර්ෂ එකක (1) කාලයක දී සාමාජිකයකු වීම ස්වයංක්‍රීයව අහෝසි විය යුතු ය.

3. සාමාජිකත්වය අත්හිටවනු ලැබූ සාමාජිකයකුට සාමාජිකත්වයෙන් ඉවත් වීමේ අයිතිවාසිකම හැර මෙම ගිවිසුම යටතේ අන් කිසිදු අයිතිවාසිකමක් භුක්තිවිඳීමට හිමිකම් නොලැබිය යුතු නමුත් සිය සියලුම බැඳීම්වලට තවදුරටත් යටත් විය යුතු ය.

39 වන ව්‍යවස්ථාව - ගිණුම් පියවීම

1. සාමාජික රාජ්‍යයක සාමාජිකත්වය අහෝසි වූ දිනට පෙර ගිවිසුම් ගත වූ ණය, ඇපකර, ව්‍යාපාර වස්තු හෝ 11 වන ව්‍යවස්ථාවේ 2 (vi) වන ඡේදය යටතේ වෙනත් ආකාරයේ මූල්‍යන පහසුකම් (මින් මතු වෙනත් මූල්‍යන පහසුකම් යනුවෙන් හඳුන්වනු ලබන) ආදියෙහි කවර හෝ කොටසක් එකී සාමාජිකත්වය අහෝසි වූ දිනට පසුව හිඟව පවතින තෙක්, එම සාමාජිකයා බැංකුව කෙරෙහි වන සිය ඍජු බැඳීම් සහ අසම්භව්‍ය බැරකම් සම්බන්ධයෙන් තවදුරටත් බැංකුවට බැඳී සිටිය යුතු නමුත්, එකී දිනට පසුව බැංකුව විසින් එළැඹි ණය, ඇපකර, ව්‍යාපාර වස්තු හෝ වෙනත් මූල්‍යන පහසුකම් වෙනුවෙන් හෝ බැංකුවේ ආදායම් හෝ වියදම් සම්බන්ධයෙන් කිසිදු කොටසකට හෝ කිසිදු බැඳීමකට යටත් නොවිය යුතු ය.

2. සාමාජික රාජ්‍යයක සාමාජිකත්වය අහෝසි වන අවස්ථාවේ දී, මෙම ව්‍යවස්ථාවේ 3 වන සහ 4 වන ඡේදවල විධිවිධාන ප්‍රකාර එම රාජ්‍යයට අදාළ ගිණුම් පියවීමේ කොටසක් වශයෙන් එම රාජ්‍යය සතු කොටස් නැවත මිලදී ගැනීමට බැංකුව විසින් කටයුතු සැලැස්විය යුතු ය. එම කාර්යය සඳහා කොටස් මිලදී ගැනීමේ මිල සාමාජික රාජ්‍යයේ සාමාජිකත්වය අහෝසි වන දිනට බැංකුවේ පොත්වල පෙන්වන වටිනාකම විය යුතු ය.

3. මෙම ව්‍යවස්ථාව යටතේ බැංකුව විසින් නැවත මිලදීගනු ලබන කොටස් සඳහා ගෙවීම් පහත සඳහන් කොන්දේසි මඟින් පාලනය විය යුතු යඃ-

(i) ව්‍යාපාර වස්තු ආයෝජන හෝ වෙනත් මූල්‍යන පහසුකම් වෙනුවෙන් ණය ගැනුම්කරු, ඇපකරු හෝ වෙනත් ගිවිසුම්ගත පාර්ශ්වකරුවකු වශයෙන් සාමාජික රාජ්‍යය හෝ එහි මහ බැංකුව, එහි කවර හෝ නියෝජිතායතන, උපකරණත්ව හෝ දේශපාලනික උප බෙදීම් බැංකුවට බැඳීසිටින තාක් එම රාජ්‍යය

සතු කොටස් වෙනුවෙන් අදාළ රාජ්‍යයට ගෙවිය යුතු කවර හෝ මුදලක් වේනම්, එම මුදල රඳවා තබාගත යුතු අතර බැංකුවේ මනාපය පරිදි එකී කවර හෝ බැරකමක් පූර්ණත්වයට පත්වූ විට එම බැරකම පියවීම සඳහා අදාළ කරගනු ලැබිය හැකි ය. 6 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයට අනුව සිය කොටස් දායකත්වය මත ඉදිරි කැඳවීම්වලට අදාළ එම රාජ්‍යයේ අසම්භව්‍ය බැරකම වෙනුවෙන් කිසිදු මුදලක් රඳවා ගනු නොලැබිය යුතු ය. කොටස් දායකත්වය වෙනුවෙන් කිසිදු හිඟ මුදලක් ගෙවීමට නොමැති සාමාජික රාජ්‍යයක් සම්බන්ධයෙන් ගෙවීමට ඇති කිසිදු වටිනාකමක් එම රාජ්‍යයේ සාමාජිකත්වය අහෝසි වූ දින සිට මාස හයක් (6) ගතවන තුරු සිදු කරනු නොලැබිය යුතු ය.

(ii) අදාළ සාමාජික රාජ්‍යය විසින් අනුරූපී කොටස් සහතික භාරදෙනු ලැබූ විට මෙම ව්‍යවස්ථාවේ 2 වන ඡේදයට අනුව මිලදී ගැනුම් මිල වශයෙන් ලැබිය යුතු මුදල මෙම ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් ණය, ව්‍යාපාර වස්තු සහ වෙනත් මූල්‍යන පහසුකම් මත වන සමුච්චිත බැරකම්වල අගය ඉක්මවන ප්‍රමාණයට, මුළු මිලදී ගැනුම් මිල එම සාමාජික රාජ්‍යයට ලැබෙන තෙක් වරින් වර කොටස් සඳහා ගෙවීම් කරනු ලැබිය හැකි ය.

(iii) බැංකුවේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින් බැංකුව විසින් තීරණය කරනු ලබන පවත්නා මුදල් ඒකකයකින් අදාළ ගෙවීම් කරනු ලැබිය යුතු ය.

(iv) සාමාජික රාජ්‍යයක සාමාජිකත්වය අහෝසි වන දිනට නොගෙවූ කවර හෝ ණය, ව්‍යාපාර වස්තු සහ වෙනත් මූල්‍යන පහසුකම් මත බැංකුවට පාඩුවිඳ ගැනීමට සිදුව ඇත්නම්, සහ එකී පාඩුව, පාඩුවලට එරෙහිව එදින වන විට සලසා දී ඇති සංචිත අගය ඉක්මවා ඇත්නම්, කොටස් නැවත මිලදී ගැනුම් මිල තීරණය කිරීමේ දී එකී පාඩු සැලකිල්ලට ගනු ලැබුවේ නම් නැවත මිලදී ගැනුම් මිල අඩු කරනු ලැබිය හැකි ව තිබූ මුදල ඉල්ලූ විට අදාළ රාජ්‍යය විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය. ඊට අමතරව, එහි කොටස් නැවත මිලදී ගැනුම් මිල තීරණය කරනු ලැබූ අවස්ථාවේ දී ප්‍රාග්ධන හීනවීමක් සිදු වූයේ නම්, සහ කැඳවීමක් සිදුකර තිබුණේ නම් ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට නියමව තිබූ ප්‍රමාණයට 6 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයට අනුව නොගෙවූ දායකත්වය සඳහා වන කවර හෝ කැඳවීමක් සම්බන්ධයෙන් සාමාජිකත්වයෙන් ඉවත්වූ සාමාජිකයා වගකීමට යටත් විය යුතු ය.

4. යම් සාමාජික රාජ්‍යයක් සාමාජිකත්වයෙන් ඉවත් වූ දින සිට මාස හයක් (6) ඇතුළත 41 වන ව්‍යවස්ථාවට අනුකූලව බැංකුව විසින් එහි මෙහෙයුම් අවසන් කරනු ලබන්නේ නම්, 41 සිට 43 දක්වා වන ව්‍යවස්ථාවල විධිවිධාන ප්‍රකාර අදාළ රාජ්‍යය සතු සියලු අයිතිවාසිකම් පිළිබඳව නිශ්චය කරනු ලැබිය යුතු ය. එකී ව්‍යවස්ථාවල කාර්යය සඳහා එවැනි සාමාජික රාජ්‍යයන් සාමාජිකයන් වශයෙන් සැලකිය යුතු නමුත් ඔවුන්ට ඡන්ද අයිතිය හිමි නොවිය යුතු ය.

## VIII වන පරිච්ඡේදය

### බැංකුවේ මෙහෙයුම් අත්හිටුවීම සහ අවසන් කිරීම

**40 වන ව්‍යවස්ථාව - මෙහෙයුම් තාවකාලිකව අත්හිටුවීම**

හදිසි අවස්ථාවක දී නව ණය නිකුත් කිරීම්, ඇපකර, ව්‍යාපාර වස්තු ආයෝජන සහ 11 වන ව්‍යවස්ථාවේ 2 (vi) අනුඡේදය යටතේ වෙනත් මූල්‍යන පහසුකම් ආදියට අදාළ මෙහෙයුම්, පාලක මණ්ඩලය විසින් ඒ පිළිබඳව වැඩිදුරටත් සලකාබලා ක්‍රියාමාර්ග ගැනීමේ අවස්ථාවට යටත්ව, තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය.

**41 වන ව්‍යවස්ථාව - මෙහෙයුම් අවසන් කිරීම**

1. බැංකුව විසින්, 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයෙන් සම්මත කරගනු ලබන පාලක මණ්ඩලයේ යෝජනාවක් මගින් බැංකුවේ මෙහෙයුම් අවසන් කරනු ලැබිය හැකි ය.

2. එසේ මෙහෙයුම් අවසන් කිරීමෙන් පසුව, බැංකුවේ වත්කම් ක්‍රමානුකූලව උපලබ්ධිය, සුරක්ෂණය සහ සංරක්ෂණය සහ එහි බැඳීම් පියවීම ආදියට ආනුෂංගික ක්‍රියාකාරකම් හැර අනෙකුත් සියලු ක්‍රියාකාරකම් බැංකුව විසින් වහාම අවසන් කරනු ලැබිය යුතු ය.

**42 වන ව්‍යවස්ථාව - සාමාජිකයන්ගේ වගකීම් සහ හිමිකම් ඉල්ලීම් සඳහා ගෙවීම් කිරීම**

1. බැංකුවේ මෙහෙයුම් අවසන් කරනු ලැබූ විට, සියලු අසම්භව්‍ය හිමිකම් ඉල්ලීම් ඇතුළු ණය හිමියන්ගේ සියලු හිමිකම් ඉල්ලීම් පියවනු ලබන තෙක් බැංකුවේ නොකැඳවූ ස්කන්ධ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් සහ තම විනිමය අවප්‍රමාණ වීම සම්බන්ධයෙන් වන සියලුම සාමාජිකයන්ගේ වගකීම අඛණ්ඩව බලාත්මක විය යුතු ය.

2. ඍජු හිමිකම් ඉල්ලීම් දරන සියලුම ණය හිමියන් සඳහා ප්‍රථමයෙන් බැංකුවේ වත්කම්වලින් ද අනතුරුව, බැංකුවට ලැබෙන ගෙවීම්වලින් හෝ නොගෙවූ හෝ කැඳවිය හැකි දායකත්ව මුදල් වලින් ගෙවීම් කරනු ලැබිය යුතු ය. ඍජු හිමිකම් ඉල්ලීම් දරන ණය හිමියන් සඳහා කවර හෝ ගෙවීමක්

කිරීමට පෙර, ඍජු හා අසම්භව්‍ය හිමිකම් ඉල්ලීම් දරන්නන් අතර සමානුපාතික බෙදාදීමක් තහවුරු කිරීම පිණිස, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය විනිශ්චයට අනුව අවශ්‍ය විය හැකි පරිදි කටයුතු කරනු ලැබිය යුතු ය.

**43 වන ව්‍යවස්ථාව - වත්කම් බෙදාදීම**

1. පහත සඳහන් අවශ්‍යතා එනම් -

(i) ණය හිමියන්ට ගෙවිය යුතු සියලු බැඳීම් පියවනු ලබන තෙක් හෝ ඒ සඳහා විධිවිධාන සලස්වනු ලබන තෙක්; සහ

(ii) 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයකින් පාලක මණ්ඩලය විසින් වත්කම් බෙදාදීමට තීරණය කරනු ලබන තෙක්,

බැංකුවේ ස්කන්ධ ප්‍රාග්ධනය සඳහා සාමාජිකයන්ගේ දායකත්වය සම්බන්ධයෙන් ඔවුන් වෙත කිසිදු වත්කම් බෙදාදීමක් සිදු නොකළ යුතු ය.

2. සාමාජිකයන් වෙත කරනු ලබන කවර හෝ බැංකුවේ වත්කම් බෙදාදීමක් එක් එක් සාමාජිකයා විසින් දරනු ලබන ස්කන්ධ ප්‍රාග්ධනයට ප්‍රමාණානුකූල විය යුතු අතර බැංකුව විසින් සාධාරණ සහ යුක්තිසහගත යයි සැලකිය යුතු අවස්ථාවන්හි දී සහ කොන්දේසි යටතේ එකී බෙදාදීම සිදුකළ යුතු ය. බෙදාදෙනු ලබන වත්කම් කොටස් වත්කම් වර්ගය හා ඒකාකාර විය යුතු නැත. සාමාජිකයකු විසින් බැංකුව කෙරෙහි වන සිය බැඳීම් පියවනු ලබන තෙක් එකී වත්කම් බෙදාදීමක දී සිය කොටස් ලබාගැනීමට එම සාමාජිකයා හිමිකම් නොලැබිය යුතු ය.

3. මෙම ව්‍යවස්ථාව ප්‍රකාර වත්කම් හිමිවන කවර හෝ සාමාජිකයකු විසින් බෙදාදීමට පෙර එම වත්කම් සම්බන්ධයෙන් බැංකුව භුක්තිවිඳි අයිතිවාසිකම් ඒ ආකාරයෙන්ම භුක්ති විඳිනු ලැබිය යුතු ය.

## IX වන පරිච්ඡේදය

### තත්ත්වය, මුක්තිය, වරප්‍රසාද සහ නිදහස් කිරීම්

**44 වන ව්‍යවස්ථාව - පරිච්ඡේදයේ අරමුණු**

1. බැංකුවේ අරමුණු සපුරා ගැනීමටත් බැංකුව වෙත පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීමටත් බැංකුවට හැකිවනු පිණිස, මෙම පරිච්ඡේදයේ දක්වා ඇති තත්ත්වය, මුක්තිය, වරප්‍රසාද සහ නිදහස් කිරීම් එක් එක් සාමාජික රාජ්‍යයේ දේශසීමාව ඇතුළත බැංකුවට පිරිනමනු ලැබිය යුතු ය.

2. මේ පරිච්ඡේදයේ සලස්වා ඇති විධිවිධාන තම දේශසීමාව ඇතුළත බලාත්මක කිරීම පිණිස එක් එක් සාමාජික රාජ්‍යය විසින් අවශ්‍ය පරිදි ක්‍රියාකළ යුතු අතර ඒ සම්බන්ධයෙන් තමන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව බැංකුව වෙත දැනුම්දිය යුතු ය.

**45 වන ව්‍යවස්ථාව - බැංකුවේ තත්ත්වය**

පූර්ණ නෛතික පුද්ගලභාවය බැංකුව සතු විය යුතු අතර විශේෂයෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පූර්ණ නෛතික ශක්නුතාවයක් බැංකුව සතු විය යුතු යः-

(i) ගිවිසුම් ඇතිකර ගැනීමට;

(ii) නිශ්චල සහ චංචල දේපළ අත්කර ගැනීම සහ බැහැර කිරීමට;

(iii) නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට සහ ඒවාට ප්‍රති උත්තර සැපයීම; සහ

(iv) බැංකුවේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය හෝ ප්‍රයෝජනවත් විය හැකි වෙනත් ක්‍රියාමාර්ග ගැනීම.

**46 වන ව්‍යවස්ථාව - නෛතික කාර්යපටිපාටින්ගෙන් මුක්තිය**

1. ණය ගැනීම හෝ වෙනත් මාර්ගවලින් අරමුදල් රැස්කිරීම, බැඳීම් සඳහා ඇප වීම හෝ සුරැකුම්පත් අලෙවි කිරීම, මිලදී ගැනීම හෝ ප්‍රාරක්ෂණය කිරීම මගින් හෝ ඒවා සම්බන්ධයෙන් උද්ගතවන නඩුකර සම්බන්ධයෙන් හැර සියලු ආකාර නෛතික ක්‍රියාමාර්ගවලට එරෙහි මුක්තිය බැංකුව සතු විය යුතු අතර පෙර කී නඩුකර සම්බන්ධයෙන් බැංකුවේ කාර්යාලයක් පිහිටුවා ඇති හෝ සිතාසි හෝ නොතීසි භාරගැනීම සඳහා නියෝජිතයකු පත්කරනු ලැබූ හෝ සුරැකුම්පත් නිකුත්කරනු ලැබූ හෝ ඇපවන ලද යම් රටක දේශසීමාව ඇතුළත නිසි අධිකරණ බලය සහිත අධිකරණයක පමණක් බැංකුවට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි ය.

2. මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් විධිවිධාන කුමක් වුවත්, බැංකුවේ කවර හෝ සාමාජිකයකු විසින් හෝ සාමාජිකයකුගේ කවර හෝ නියෝජිතයකු හෝ උපකරණත්වයක් හෝ සාමාජිකයකු වෙනුවෙන් ඍජුව හෝ වක්‍රව ක්‍රියාකරන හෝ සාමාජිකයකුගෙන් හෝ සාමාජිකයකුගේ කවර හෝ නියෝජිතයකුගෙන් හෝ උපකරණත්වයකින් හිමිකම් ලබන කවර හෝ ආස්ථිත්වයක් හෝ තැනැත්තෙකු විසින් බැංකුවට එරෙහිව කිසිදු නඩුකරයක් පනවනු නොලැබිය යුතු ය. බැංකුව සහ එහි සාමාජිකයන් අතර උද්ගතවන මතභේද විසඳාගැනීම පිණිස මෙම ගිවිසුමේ, බැංකුවේ අතුරු ව්‍යවස්ථා සහ නියෝගවල හෝ බැංකුව සමඟ එළැඹෙන ගිවිසුම්වල නියම කරනු ලැබිය හැකි ආකාරයට විශේෂ කාර්යපටිපාටි අනුව සිදු කළ යුතු ය.

3. කවර හෝ ස්ථානයක පිහිටා ඇති හෝ කවරෙකු හෝ විසින් දරනු ලබන බැංකුවේ දේපළ සහ වත්කම් බැංකුවට එරෙහිව අවසන් නඩු තීන්දුව ප්‍රකාශයට පත්කරනු ලබන තෙක් සියලු ආකාර තහනමට ගැනීම්, දේපළ අත්පත් කර ගැනීම හෝ ඇස්කීසි කිරීම් ආදියෙන් මුක්ත විය යුතු ය.

**47 වන ව්‍යවස්ථාව - වත්කම් සහ සංරක්ෂණාගාර පිළිබඳ මුක්තිය**

1. කවර හෝ ස්ථානයක පිහිටා ඇති හෝ කවරෙකු හෝ විසින් දරනු ලබන බැංකුවේ දේපළ සහ වත්කම් විධායක හෝ ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග මඟින් පරීක්ෂාවට ලක්කිරීම, රාජසන්තක කිරීම, බුක්තිය අත් කර ගැනීම හෝ අන් කවර හෝ ක්‍රමයක් මඟින් අත්කර ගැනීම හෝ පූර්වාවරණය ආදියෙන් මුක්ත විය යුතු ය.

2. කවර හෝ ස්ථානයක පිහිටා ඇති හෝ කවරෙකු හෝ විසින් දරනු ලබන බැංකුවේ සංරක්ෂණාගාර සහ පොදුවේ බැංකුව සතු හෝ බැංකුව විසින් දරනු ලබන සියලු ලේඛන අනුල්ලංඝනීය විය යුතු ය.

**48 වන ව්‍යවස්ථාව - වත්කම් සීමා කිරීම්වලින් නිදහස් වීම**

බැංකුවේ කාර්යය සහ කර්තව්‍ය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පමණට සහ මෙම ගිවිසුමේ විධිවිධාන වලට යටත්ව, බැංකුවේ සියලු දේපළ සහ වත්කම් කවර හෝ ස්වභාවයේ සීමා කිරීම්, නියාමන, පාලන සහ විලම්බන ආදියෙන් නිදහස් විය යුතු ය.

**49 වන ව්‍යවස්ථාව - සන්නිවේදනය පිළිබඳ වරප්‍රසාදය**

සෑම සාමාජිකයකු විසින් සෙසු කවර හෝ සාමාජික රාජ්‍යයක නිල සන්නිවේදනයකට දක්වන ආකාරයේ සැලකිල්ලක් බැංකුවේ නිල සන්නිවේදන සම්බන්ධයෙන් ද දක්වනු ලැබිය යුතු ය.

**50 වන ව්‍යවස්ථාව - නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වරප්‍රසාද සහ මුක්තිය**

බැංකුවේ දූත මෙහෙවර හෝ සේවාවන් ඉටුකරන විශේෂඥයන් සහ උපදේශකවරුන් ඇතුළු බැංකුවේ සියලු පාලකයන්, අධ්‍යක්ෂවරුන්, විකල්ප නිලධරයන්, සභාපතිවරයා, උප-සභාපතිවරුන් සහ වෙනත් නිලධරයන් සහ සේවකයන් :

(i) බැංකුව විසින් මුක්තිය අත්හරිනු ලබන අවස්ථාවන් වල දී හැර, ඔවුන් විසින් සිය නිලය මත ඉටු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් නීති කෘත්‍යයන් පැවරීමෙන් බැංකුව මුක්ත විය යුතු අතර ඔවුන්ගේ සියලු නිල පත්‍රිකා, ලේඛන සහ වාර්තා අනුල්ලංඝනීය විය යුතු ය;

(ii) ඔවුන් දේශීය පුරවැසියන් හෝ ජාතිකයන් නොවන විට, ඔවුන් සහ නිලයෙන් සමාන වන සෙසු සාමාජිකයන්ගේ නියෝජිතයන්ට, නිලධරයන්ට සහ සේවකයන්ට සාමාජිකයන් විසින් පිරිනමනු ලබන සමාන ආකාරයේ ආගමන සීමාවන්, අන්‍ය පුරවැසි ලියාපදිංචි නියමයන් සහ ජාතික සේවා බැඳීම් ආදියෙන් මුක්තිය මෙන්ම විනිමය හුවමාරු සම්බන්ධයෙන් සමාන පහසුකම් ලබා දෙනු ලැබිය යුතු ය; සහ

(iii) ඔවුන් සහ නිලයෙන් සමාන වන සෙසු සාමාජිකයන්ගේ නියෝජිතයන්ට, නිලධරයන්ට සහ සේවකයන්ට සාමාජිකයන් විසින් පිරිනමනු ලබන සමාන ආකාරයේ ප්‍රවාහන පහසුකම් ලබා දෙනු ලැබිය යුතු ය.

**51 වන ව්‍යවස්ථාව - බදු අයකිරීමෙන් නිදහස් කිරීම**

1. මෙම ගිවිසුම ප්‍රකාර බැංකුව, එහි වත්කම්, දේපළ, ආදායම් සහ එහි මෙහෙයුම් සහ ගණුදෙනු සියලු බදු අයකිරීම්වලින් සහ සියලු රේගු බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. එසේ ම කවර හෝ බදු හෝ රේගු බදු ගෙවීමේ, රඳවා තබා ගැනීමේ හෝ රැස් කිරීමේ කවර හෝ බැඳීමකින්, බැංකුව නිදහස් කරනු ලැබිය යුතු ය.

2. යම් සාමාජික රාජ්‍යයක් විසින් සිය අපරානුමත කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ සාධනපත්‍රය සමග එම සාමාජික රාජ්‍යයේ පුරවැසියන් හෝ ජාතිකයන් සඳහා බැංකුව විසින් අවස්ථාවෝචිත පරිදි ගෙවනු ලබන වැටුප් සහ පාරිශ්‍රමික මත බදු අයකිරීමේ අයිතිය තමන් වෙත සහ තම දේශපාලනික උපබෙදීම් වෙත රඳවා තබාගන්නා බවට ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් මිස, බැංකුව විසින් බැංකුවේ දූත මෙහෙවර හෝ සේවාවන් ඉටුකරන විශේෂඥයන් සහ උපදේශකවරුන් ඇතුළු බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට, විකල්ප අධ්‍යක්ෂවරුන්ට, සභාපතිවරයාට, උප-සභාපතිවරුන්ට සහ සෙසු නිලධරයන්ට සහ සේවකයන්ට අවස්ථාවෝචිත පරිදි ගෙවනු ලබන වැටුප්, පාරිශ්‍රමික සහ වියදම් සම්බන්ධයෙන් කවර හෝ ආකාරයේ බද්දක් නොපැනවිය යුතු ය.

3. කවරකු හෝ විසින් දරනු ලබන කවර හෝ බැඳීම් හෝ බැංකුව විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් මත වන කවර හෝ ලාභාංශ හෝ පොළී ඇතුළු එකී බැඳීම් හෝ සුරැකුම්පත් මත,

(i) හුදෙක්, අදාළ බැඳීම හෝ සුරැකුම්පත බැංකුව විසින් නිකුත් කරනු ලැබ තිබීම යන කාරණය මත වෙනස් ආකාරයෙන් සළකනු ලබන; හෝ

(ii) හුදෙක් අදාළ බැඳීම හෝ සුරැකුම්පත නිකුත් කරනු ලැබූ, ගෙවිය යුතු වූ හෝ ගෙවන ලද ස්ථානය හෝ ව්‍යවහාර මුදල හෝ බැංකුව විසින් පවත්වා ගෙනයනු ලබන කවර හෝ කාර්යාලයක හෝ ව්‍යාපාරික ස්ථානයක පිහිටීම බඳු අයකිරීමේ අධිකාරි බල ප්‍රදේශ පදනම වන්නා වූ;

කවර හෝ ආකාරයේ කිසිදු බද්දක් නොපැන විය යුතු ය.

4. කවරකු හෝ විසින් දරනු ලබන කවර හෝ බැඳීම් හෝ බැංකුව විසින් ඇප වන ලද සුරැකුම්පත් මත වන කවර හෝ ලාභාංශ හෝ පොළී ඇතුළු එකී බැඳීම් හෝ සුරැකුම්පත් මත,

(i) හුදෙක්, අදාළ බැඳීම හෝ සුරැකුම්පත සඳහා බැංකුව විසින් ඇපවනු ලැබ තිබීම යන කාරණය මත වෙනස් ආකාරයෙන් සළකනු ලබන; හෝ

(ii) හුදෙක් බැංකුව විසින් පවත්වා ගෙනයනු ලබන කවර හෝ කාර්යාලයක හෝ ව්‍යාපාරික ස්ථානයක පිහිටීම අදාළ බඳු අයකිරීමේ අධිකාරි බල ප්‍රදේශ පදනම වන්නා වූ;

කවර හෝ ආකාරයේ කිසිදු බද්දක් නොපැන විය යුතු ය.

**52 වන ව්‍යවස්ථාව - අත්හැරීම්**

බැංකුවේ උපරිම යහපත පිණිස බැංකුව විසින් යෝග්‍ය යයි නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ කොන්දේසි මත, කවර හෝ අවස්ථාවක දී හෝ තත්ත්වයක් යටතේ මෙම පරිච්ඡේදය ප්‍රකාර පවරා දෙනු ලබන කවර හෝ වරප්‍රසාද, මුක්තීන් සහ නිදහස් කිරීම් බැංකුව විසින් තම අභිමතය පරිදි අත් හරිනු ලැබිය හැකි ය.

## X වන පරිච්ඡේදය

### සංශෝධන, අර්ථනිරූපණ සහ බේරුම්කරණය

**53 වන ව්‍යවස්ථාව - සංශෝධන**

1. 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි අති බහුතර ඡන්දයෙන් සම්මත කරගනු ලබන පාලක මණ්ඩලයේ යෝජනා සම්මතයකින් පමණක් මෙම ගිවිසුම සංශෝධනය කරනු ලැබිය හැකි ය.

2. මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද ,

(i) බැංකුවෙන් ඉවත්වීමේ අයිතිය;

(ii) 7 වන ව්‍යවස්ථාවේ 3 වන සහ 4 වන ඡේදවල විධිවිධාන සලස්වා ඇති වගකීම් පිළිබඳ සීමා කිරීම්; සහ

(iii) 5 වන ව්‍යවස්ථාවේ 4 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති ප්‍රාග්ධන ස්කන්ධ මිලදී ගැනීමට අදාළ අයිතිවාසිකම්;

වෙනස් කෙරෙන කවර හෝ සංශෝධනයක් සඳහා පාලක මණ්ඩලයේ ඒකමතික එකඟත්වය අවශ්‍ය විය යුතු ය.

3. යම් සාමාජිකයකු විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ඉදිරිපත් කරනු ලබන්නා වූ මෙම ගිවිසුම සංශෝධනය කිරීම සඳහා වන කවර හෝ යෝජනාවක් පිළිබඳව පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත දැනුම්දිය යුතු අතර ඔහු විසින් එම යෝජනාව පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. යම් සංශෝධනයක් සම්මත කරනු ලැබූ විට, බැංකුව විසින් සියලුම සාමාජිකයන් ඇමතූ නිල නිවේදනයක් මඟින් එම සංශෝධනය සහතික කරනු ලැබිය යුතු ය. පාලක මණ්ඩලය විසින් එකී නිල නිවේදනයේ වෙනත් කාල පරිච්ඡේදයක් නියම කරනු ලබන්නේ නම් මිස, එකී නිවේදනයේ දින සිට මාස තුනකට (3) පසුව සියලුම සාමාජිකයන් සම්බන්ධයෙන් එම සංශෝධනය බලාත්මක විය යුතු ය.

54 වන ව්‍යවස්ථාව - අර්ථනිරූපණ

1. මෙම ගිවිසුමේ විධිවිධාන අර්ථනිරූපණය කිරීම හෝ අදාළ කර ගැනීම සම්බන්ධයෙන් කවර හෝ සාමාජිකයකු සහ බැංකුව අතර හෝ බැංකුවේ සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතර හෝ ඇති වන කවර හෝ ප්‍රශ්නයක් පිළිබඳව තීරණය කිරීම පිණිස එම ප්‍රශ්නය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කළ යුතු ය. සලකා බලනු ලබන කාරණය මඟින් විශේෂ බලපෑමකට ලක්වන සාමාජික රාජ්‍යයට අයත් ජාතිකයකු අධ්‍යක්ෂ මණ්ඩලයේ නොමැති නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකී සංශෝධන සලකා බලනු ලබන අවස්ථාවේ දී අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුව නියෝජනය කිරීමට එකී සාමාජික රාජ්‍යයට හිමිකම් ලැබිය යුතු ය. කෙසේ වුව ද, එසේ නියෝජනය කරනු ලබන සාමාජිකයාට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමි නොවිය යුතු ය. එසේ නියෝජනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමනය කරනු ලැබිය යුතු ය.

2. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය යටතේ තීරණයක් දෙනු ලැබූ විට, කවර හෝ සාමාජිකයකු විසින් අදාළ ප්‍රශ්නය පාලක මණ්ඩලය වෙත යොමු කරවනු ලැබිය හැකි අතර පාලක මණ්ඩලයේ තීරණය අවසානාත්මක වන්නේ ය. පාලක මණ්ඩලයේ තීරණය ලැබෙන තෙක්, බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන ප්‍රමාණයට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පදනම් කර ගනිමින් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

**55 වන ව්‍යවස්ථාව - බේරුම්කරණය**

සාමාජිකත්වය අහෝසි වූ රාජ්‍යයක් සහ බැංකුව අතර හෝ බැංකුවේ මෙහෙයුම් අවසන් කිරීමට යෝජනාවක් සම්මත කර ගනු ලැබීමෙන් පසුව බැංකුව සහ කවර හෝ සාමාජිකයකු අතර යම් මත භේදයක් පැන නැඟුනහොත්, එවැනි මත භේදයක් බේරුම්කරුවන් තිදෙනෙකුගෙන් සමන්විත බේරුම්කරණ මණ්ඩලයක් වෙත බේරුම්කරණය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. බැංකුව විසින් එක් බේරුම්කරුවකු පත් කරනු ලැබිය යුතු අතර අදාළ රාජ්‍යය විසින් තවත් බේරුම්කරුවකු ද, අදාළ පාර්ශ්ව විසින් අන්‍යාකාරයෙන් එකඟවන්නේ නම් මිස, ජාත්‍යන්තර අධිකරණයේ සභාපතිවරයා විසින් හෝ පාලක මණ්ඩලය විසින් සම්මත කරනු ලබන නියෝග මඟින් නියම කරනු ලැබ තිබිය හැකි වෙනත් බලධරයකු විසින් තෙවැනි බේරුම්කරු පත් කරනු ලැබිය යුතු ය. බේරුම්කරණ තීරණයක් ගැනීම සඳහා බේරුම්කරුවන්ගේ බහුතර ඡන්දය ප්‍රමාණවත් විය යුතු අතර එම තීරණය අවසානාත්මක විය යුතු සහ පාර්ශ්වකරුවන් එම තීරණය මඟින් බැඳී සිටිය යුතු ය. පාර්ශ්වකරුවන් අතර මත භේදයක් උද්ගත වූ කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් වන සියලු පටිපාටික ගැටලු නිරාකරණය කිරීමට තෙවැනි බේරුම්කරුට බලය පවරා දෙනු ලැබිය යුතු ය.

**56 වන ව්‍යවස්ථාව - අනුමතය ලබාදෙනු ලැබූ සේ සැලකීම**

53 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදය යටතේ හැර බැංකුව විසින් කරනු ලැබිය හැකි කවර හෝ ක්‍රියාවකට පෙරාතුව කවර හෝ සාමාජික රාජ්‍යයක අනුමතය ඒ සඳහා ලබාගැනීම අවශ්‍ය වන සෑම අවස්ථාවකම, යෝජිත ක්‍රියාව පිළිබඳව සාමාජිකයාට දැනුම්දෙමින් බැංකුව විසින් නියම කරනු ලැබිය හැකි සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළත අදාළ සාමාජිකයා විසින් විරෝධතාවක් ඉදිරිපත් කරන්නේ නම් මිස, ඒ සඳහා අනුමතය ලබා දෙනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.

## XI වන පරිච්ඡේදය

### අවසාන විධිවිධාන

**57 වන ව්‍යවස්ථාව - අත්සන සහ භාරදීම**

1. (මෙහි මින් මතු "සන්ධනධාරියා" වශයෙන් හඳුන්වනු ලබන) මහජන චීන සමූහාණ්ඩුව වෙත භාරදෙනු ලබන මෙම ගිවිසුම අ උපලේඛනයේ නම් සඳහන් රාජ්‍යයන්හි රජයන් විසින් අත්සන් තැබීම සඳහා 2015 දෙසැම්බර් මස 31 වන දින දක්වා විවෘතව තැබිය යුතු ය.

2. සන්ධනධාරියා විසින් මෙම ගිවිසුමේ සහතික කරන ලද පිටපත් එහි සියලුම අත්සන්කාර රාජ්‍යයන් වෙත සහ බැංකුවේ සාමාජිකයන් වන්නා වූ අනෙකුත් රාජ්‍යයන් වෙත යවනු ලැබිය යුතු ය.

**58 වන ව්‍යවස්ථාව - පිළිගැනුම සහ අනුමතය**

1. මෙම ගිවිසුම එහි අත්සන්කාර රාජ්‍යයන් විසින් අපරානුමත කිරීමට, පිළිගැනීමට හෝ අනුමත කිරීමට යටත් විය යුතු ය. අපරානුමත කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම පිළිබඳ සාධනපත්‍ර 2016 දෙසැම්බර් 31 වන දිනට පෙර හෝ පාලක මණ්ඩලය විසින් 28 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශේෂ බහුතර ඡන්දයකින් තීරණය කරනු ලැබිය හැකි ඊට පසුව එළඹෙන දිනයකට පෙර සන්ධනධාරියා වෙත භාරදෙනු ලැබිය යුතු ය. එසේ කරනු ලබන එක් එක් භාරදීමක් පිළිබඳව සහ එම භාරදීමේ දිනය සන්ධනධාරියා විසින් අනෙකුත් අත්සන්කාර රාජ්‍යයන් වෙත යථා පරිදි දැනුම්දෙනු ලැබිය යුතු ය.

2. මෙම ගිවිසුම බලාත්මක වන දිනට පෙර තම අපරානුමත කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම පිළිබඳ සාධනපත්‍රය භාරදෙනු ලබන අත්සන්කාර රාජ්‍යය එසේ භාරදෙනු ලබන දින සිට බැංකුවේ සාමාජිකත්වයට පත්විය යුතු ය. පූර්වගාමී ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන අනෙකුත් අත්සන්කාර රාජ්‍යයන් තම අපරානුමත කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම පිළිබඳ සාධනපත්‍රය භාරදෙනු ලබන දින සිට බැංකුවේ සාමාජිකත්වයට පත්විය යුතු ය.

**59 වන ව්‍යවස්ථාව - බලාත්මක වීම**

මෙම ගිවිසුමේ 'අ' උපලේඛනයේ දක්වා ඇති පරිදි සිය ආරම්භක කොටස් දායකත්වයේ එකතුව එකී දායකත්වයේ මුළු වටිනාකමින් සියයට පනහකට (50) නොඅඩු වන යටත් පිරිසෙයින් අත්සන්කාර රාජ්‍යයන් දහයක් (10) විසින් තම අපරානුමත කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම පිළිබඳ සාධනපත්‍ර භාරදෙනු ලැබූ විට මෙම ගිවිසුම බලාත්මක විය යුතු ය.

**60 වන ව්‍යවස්ථාව - සමාරම්භක රැස්වීම සහ මෙහෙයුම් ආරම්භ කිරීම**

1. මෙම ගිවිසුම බලාත්මක වූ වහාම එක් එක් සාමාජිකයින් විසින් පාලකවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර සන්ධනධාරියා විසින් පාලක මණ්ඩලයේ සමාරම්භක රැස්වීම කැඳවනු ලැබිය යුතු ය.

2. සිය සමාරම්භක රැස්වීමේ දී පාලක මණ්ඩලය විසින් -

(i) සභාපතිවරයා තෝරා පත්කර ගනු ලැබිය යුතු ය;

(ii) 25 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදය අනුව බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත්කර ගනු ලැබිය යුතු අතර මෙතෙක් සාමාජිකත්වයට පත් නොවූ සාමාජිකයන් සහ අත්සන්කාර රාජ්‍යයන් සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින්, වර්ෂ දෙකකට අඩු ආරම්භක කාලයක් සඳහා අධ්‍යක්ෂවරුන් අඩු සංඛ්‍යාවක් පත්කර ගැනීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ය;

(iii) බැංකුව විසින් සිය මෙහෙයුම් ආරම්භ කරනු ලැබිය යුතු දිනය තීරණය කිරීම සඳහා කටයුතු යෙදිය යුතු ය; සහ

(iv) මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය විය හැකි අනෙකුත් කටයුතු සඳහා සැලසුම් යෙදිය යුතු ය.

3. බැංකුවේ මෙහෙයුම් ආරම්භ කරනු ලබන දිනය බැංකුව විසින් සිය සාමාජික රාජ්‍යයන් වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

වර්ෂ 2015ක් වූ ජුනි මස 29 වන දින මහජන චීන සමූහාණ්ඩුවේ බීජිං නුවර දී සකස් කරන ලද, එකම මුල් පිටපත සත්ධනධාරියාගේ ලේඛනාගාරයේ තැන්පත් කරන්නට යෙදුනා වූ අතර එහි ඉංග්‍රීසි, චීන සහ ප්‍රංශ භාෂා පාඨ එකසේ සත්‍යවත් වන්නේ ය.

### අ උපලේඛනය

58 වන ව්‍යවස්ථාවට අනුව සාමාජිකයන් වන රාජ්‍යයන් සඳහා අනුමත ස්කන්ධ ප්‍රාග්ධනයේ ආරම්භක දායකත්වය

### අ කොටස
### කලාපීය සාමාජික රාජ්‍යයන්

| | *කොටස් සංඛ්‍යාව* | *ප්‍රාග්ධනයේ දායකත්ව ($ මිලියන වලින්)* |
|---|---:|---:|
| ඕස්ට්‍රේලියාව | 36,912 | 3,691.2 |
| අසර්බයිජානය | 2,541 | 254.1 |
| බංග්ලාදේශය | 6,605 | 660.5 |
| බෲනායි දරුස්ලාම් | 52,4 | 52.4 |
| කාම්බෝජය | 623 | 62.3 |
| චීනය | 297,804 | 29,780.4 |
| ජෝර්ජියාව | 539 | 53.9 |
| ඉන්දියාව | 83,673 | 8,367.3 |

| | | |
|---|---|---|
| ඉන්දුනිසියාව | 33,607 | 3,360.7 |
| ඉරානය | 15,808 | 1,580.8 |
| ඊශ්‍රායලය | 7,499 | 749.9 |
| ජෝර්දානය | 1,192 | 119.2 |
| කසකස්ථානය | 7,293 | 729.3 |
| කොරියාව | 37,388 | 3,738.8 |
| කුවේටය | 5,360 | 536.0 |
| කර්ගිස් ජනරජය | 268 | 26.8 |
| ලාඕස් මහජන ප්‍රජාතාන්ත්‍රික ජනරජය | 430 | 43.0 |
| මලයාසියාව | 1,095 | 109.5 |
| මාලදිවයින | 72 | 7.2 |
| මොන්ගෝලියාව | 411 | 41.1 |
| මියන්මාරය | 2,645 | 264.5 |
| නේපාලය | 809 | 80.9 |
| නවසීලන්තය | 4,615 | 461.5 |
| ඕමානය | 2,592 | 259.2 |
| පාකිස්ථානය | 10,341 | 1,034.1 |
| පිලිපීනය | 9,791 | 979.1 |
| කටාර් | 6,044 | 604.4 |
| රුසියාව | 65,362 | 6,536.2 |
| සෞදි අරාබිය | 25446 | 2,544.6 |
| සිංගප්පූරුව | 2,500 | 250.0 |
| ශ්‍රී ලංකාව | 2,690 | 269.0 |
| තජිකිස්ථානය | 309 | 30.9 |
| තායිලන්තය | 14,275 | 1,427.5 |
| තුර්කිය | 26,099 | 2,609.9 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 11,857 | 1,185.7 |
| උස්බෙකිස්ථානය | 2,198 | 219.8 |
| වියට්නාමය | 6,633 | 663.3 |
| වෙන් කරනු නොලැබූ | 16,150 | 1,615.0 |
| එකතුව | 750,000 | 75,000.0 |

ආ කොටස

**කලාපීය නොවන සාමාජික රාජ්‍යයන්**

| | *කොටස් සංඛ්‍යාව* | *ප්‍රාග්ධනයේ දායකත්ව ($ මිලියන වලින්)* |
|---|---|---|
| ඔස්ට්‍රියාව | 5,008 | 500.8 |
| බ්‍රසීලය | 31,810 | 3,181.0 |
| ඩෙන්මාර්කය | 3,695 | 369.5 |
| ඊජිප්තුව | 6,505 | 650.5 |
| පින්ලන්තය | 3,103 | 310.3 |
| ප්‍රංශය | 33,756 | 3,375.6 |
| ජර්මනිය | 44,842 | 4,484.2 |
| අයිස්ලන්තය | 176 | 17.6 |
| ඉතාලිය | 25,718 | 2,571.8 |
| ලක්සම්බර්ග් | 697 | 69.7 |
| මෝල්ටාව | 136 | 13.6 |
| නෙදර්ලන්තය | 10,313 | 1,031.3 |
| නෝර්වේ | 5,506 | 550.6 |
| පෝලන්තය | 8,318 | 831.8 |
| පෘතුගාලය | 650 | 65.0 |
| දකුණු අප්‍රිකාව | 5,905 | 590.5 |
| ස්පාඤ්ඤය | 17,615 | 1,761.5 |
| ස්වීඩනය | 6,300 | 630.0 |
| ස්විස්ටර්ලන්තය | 7,064 | 706.4 |
| එක්සත් රාජධානිය | 30,547 | 3,054.7 |
| වෙන් කරනු නොලැබූ | 2,336 | 233.6 |
| එකතුව | 250,000 | 25,000.0 |
| මුළු එකතුව | 1,000,000 | 100,000.0 |

'ආ' උපලේඛනය

**අධ්‍යක්ෂවරුන් තෝරා පත්කර ගැනීම**

පහත සඳහන් විධිවිධානවලට අනුව අධ්‍යක්ෂවරුන් තෝරා පත්කර ගැනීමේ එක් එක් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා පාලක මණ්ඩලය විසින් රීති නියම කරනු ලැබිය යුතු ය.

1. *ඡන්ද කොට්ඨාස.* - එක් එක් අධ්‍යක්ෂවරයා විසින් යම් ඡන්ද කොට්ඨාසයකට අයත් සාමාජික රාජ්‍ය එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නියෝජනය කරනු ලැබිය යුතු ය. එක් එක් ඡන්ද කොට්ඨාසයේ ඡන්ද බලය 28 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදය යටතේ අධ්‍යක්ෂවරයා හිමිකම් ලබන ඡන්ද සංඛ්‍යාවෙන් සමන්විත විය යුතු ය.

2. *ඡන්ද කොට්ඨාසයේ ඡන්ද බලය.* - එක් එක් ඡන්ද විමසීම සඳහා පාලකයන් විසින් කලාපීය සාමාජික රාජ්‍ය නියෝජනය වන පරිදි තෝරා පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන්ට (කලාපීය අධ්‍යක්ෂවරුන්) අවම ඡන්ද කොට්ඨාස ඡන්ද බල ප්‍රතිශතයක් සහ පාලකයන් විසින් කලාපීය නොවන සාමාජික රාජ්‍ය නියෝජනය වන පරිදි තෝරා පත්කරනු ලබන අධ්‍යක්ෂවරුන්ට (කලාපීය නොවන අධ්‍යක්ෂවරුන්) අවම ඡන්ද කොට්ඨාස ඡන්ද බල ප්‍රතිශතයක් පාලක මණ්ඩලය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(අ) කලාපීය අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් අවම ඡන්ද ප්‍රතිශතය, කලාපීය සාමාජික රාජ්‍ය නියෝජනය කරන පාලකයන් (කලාපීය පාලකයන්) විසින් ඡන්ද විමසීමක දී ප්‍රකාශ කරනු ලැබීමට සුදුසුකම් ලබන මුළු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් නියම කළ යුතු ය. කලාපීය අධ්‍යක්ෂවරුන් සඳහා ආරම්භක අවම ප්‍රතිශතය 6%ක් විය යුතු ය.

(ආ) කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් අවම ඡන්ද ප්‍රතිශතය, කලාපීය නොවන සාමාජික රාජ්‍ය නියෝජනය කරන පාලකයන් (කලාපීය නොවන පාලකයන්) විසින් ඡන්ද විමසීමක දී ප්‍රකාශ කරනු ලැබීමට සුදුසුකම් ලබන මුළු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් නියම කළ යුතු ය. කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් සඳහා ආරම්භක අවම ප්‍රතිශතය 15%ක් විය යුතු ය.

3. *ප්‍රතිශත ගැලපීම.* - මෙහි පහත 7 වන ඡේදය යටතේ තදනන්තර ඡන්ද විමසීම් වාර කිහිපයක් පැවැත්වීම අවශ්‍ය වූ විට, ඡන්ද කොට්ඨාස අතර ඡන්ද බලය ගැලපීම පිණිස පාලක මණ්ඩලය විසින් එක් එක් ඡන්ද විමසීම වෙනුවෙන් කලාපීය අධ්‍යක්ෂවරුන් සඳහා එක් ගැලපීම් ප්‍රතිශතයක් සහ කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් සඳහා එක් ගැලපීම් ප්‍රතිශතයක් නියම කරනු ලැබිය යුතු ය. ඒ එක් එක් ගැලපීම් ප්‍රතිශතය ඊට අනුරූපී අවම ප්‍රතිශතයට වඩා වැඩි විය යුතු ය.

(අ) කලාපීය අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් ගැලපීම් ප්‍රතිශතය, කලාපීය පාලකයන් විසින් ඡන්ද විමසීමක දී ප්‍රකාශ කරනු ලැබීමට සුදුසුකම් ලබන මුළු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් නියම කළ යුතු ය. කලාපීය අධ්‍යක්ෂවරුන් සඳහා ආරම්භක ගැලපීම් ප්‍රතිශතය 15%ක් විය යුතු ය.

(ආ) කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් ගැලපීම් ප්‍රතිශතය, කලාපීය නොවන පාලකයන් විසින් ඡන්ද විමසීමක දී ප්‍රකාශ කරනු ලැබීමට සුදුසුකම් ලබන මුළු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් නියම කළ යුතු ය. කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් සඳහා ආරම්භක ගැලපීම් ප්‍රතිශතය 60%ක් විය යුතු ය.

4. *ඡන්ද අපේක්ෂකයින් සංඛ්‍යාව.* - එක් එක් ඡන්ද විමසීම සඳහා, 25 වන ව්‍යවස්ථාවේ 2 වන ඡේදය ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණය සහ සංයුතිය පිළිබඳව කරනු ලබන සිය තීරණයට අනුව තෝරා පත්කර ගත යුතු කලාපීය අධ්‍යක්ෂවරුන් සහ කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පාලක මණ්ඩලය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(අ) ආරම්භක කලාපීය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව නවදෙනෙක් විය යුතු ය.

(ආ) ආරම්භක කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තිදෙනෙක් විය යුතු ය.

5. *නාමයෝජනා.* - එක් පාලකයෙකු විසින් එක් නාමයෝජනාවක් පමණක් කරනු ලැබිය හැකි ය. කලාපීය අධ්‍යක්ෂ ධූරය සඳහා කලාපීය පාලකයන් විසින් නාමයෝජනා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර කලාපීය නොවන අධ්‍යක්ෂ ධූරය සඳහා කලාපීය නොවන පාලකයන් විසින් නාමයෝජනා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. *ඡන්දය ප්‍රකාශ කිරීම.* - එක් එක් පාලකයා පත්කරනු ලබන සාමාජික රාජ්‍යය 28 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදය යටතේ හිමිකම් ලබන සියලුම ඡන්ද සංඛ්‍යාව අදාළ පාලකයා විසින් එක් ඡන්ද අපේක්ෂකයකු වෙනුවෙන් භාවිත කරනු ලැබිය හැකි ය. කලාපීය අධ්‍යක්ෂවරුන් තෝරා පත්කර ගැනීම කලාපීය පාලකයන්ගේ ඡන්දයෙන් සිදු කළ යුතු ය. කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් තෝරා පත්කර ගැනීම කලාපීය නොවන පාලකයන්ගේ ඡන්දයෙන් සිදු කළ යුතු ය.

7. *පළමුවර ඡන්දය විමසීම.* - පළමුවර ඡන්දය විමසීමේ දී තෝරා පත්කර ගත යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවට අනුව ඉහළම ඡන්ද සංඛ්‍යාව ලබාගන්නා ඡන්ද අපේක්ෂකයන් තෝරා පත්කරගනු ලැබිය යුතු අතර, තෝරා පත්කරගනු ලැබීම සඳහා යම් ඡන්ද අපේක්ෂකයකු විසින් අදාළ අවම ප්‍රතිශතයට ළඟාවීමට අවශ්‍යවන්නා වූ ප්‍රමාණවත් ඡන්ද සංඛ්‍යාවක් ලබා තිබිය යුතු ය.

(අ) පළමුවර ඡන්දය විමසීමේ දී අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තෝරා පත්කරගනු නොලබන්නේ නම්, සහ තෝරා පත්කර ගත යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සහ ඡන්ද අපේක්ෂකයන් සංඛ්‍යාව සමාන වේ නම්, අවස්ථාවෝචිත පරිදි කලාපීය අධ්‍යක්ෂවරුන් තෝරා පත්කර ගැනීමේ ඡන්දය හෝ කලාපීය නොවන අධ්‍යක්ෂවරුන් තෝරා පත්කර ගැනීමේ ඡන්දය සම්පූර්ණයෙන් පවත්වා අවසන් කිරීමට ගත යුතු තදනන්තර ක්‍රියා මාර්ග පිළිබඳව පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

8. *තදනන්තර ඡන්දය විමසීම්.* - පළමුවර ඡන්දය විමසීමේ දී අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තෝරා පත්කරගනු නොලබන්නේ නම්, සහ ඡන්ද විමසීමෙන් තෝරා පත්කර ගත යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවට වඩා වැඩි ඡන්ද අපේක්ෂකයන් සංඛ්‍යාවක් සිටි නම්, අවශ්‍ය පරිදි තදනන්තර ඡන්ද විමසීම් පවත්වනු ලැබිය යුතු ය. එකී තදනන්තර ඡන්ද විමසීම් සම්බන්ධයෙන්:

(අ) පූර්වගාමී ඡන්ද විමසීමේ දී අඩුම ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා අපේක්ෂකයා ඊළඟ ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු නොවිය යුතු ය.

(ආ) ඡන්දය ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ-

(i) පූර්වගාමී ඡන්ද විමසීමේ දී තේරීපත් නොවූ අපේක්ෂකයකු වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කළ පාලකයන් විසින්; සහ

(ii) තේරීපත් වූ අපේක්ෂකයකුට පහත (ඇ) යටතේ අදාළ ගැලපීම් ප්‍රතිශතයට ඉහළ ඡන්ද සංඛ්‍යාවක් ලබාගැනීම වෙනුවෙන් ඡන්දය ප්‍රකාශකර ඇති බවට සැලකෙන පාලකයන් විසින් පමණි.

(ඇ) සියලු පාලකයන් විසින් එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ප්‍රකාශ කරනු ලබන ඡන්ද සංඛ්‍යාවන්, අදාළ ගැලපීම් ප්‍රතිශතය නියෝජනය වන ඡන්ද සංඛ්‍යාව ඉක්මවන තෙක් අපගමන අනුපිළිවෙලින් එකතු කරනු ලැබිය යුතු ය. මුළු ඡන්ද සංඛ්‍යාව අදාළ ගැලපීම් ප්‍රතිශතය ඉක්මවීමට හේතු වූ ඡන්දය ප්‍රකාශකර ඇති බවට සැලකෙන පාලකයා ඇතුළු එකී ගණන් ගැනීමේ දී ගණනය කරන ලද ඡන්ද ප්‍රකාශ කර ඇති පාලකයන් අදාළ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කරනු ලැබ ඇති සේ සලකනු ලැබිය යුතු ය. එකී ගණන් ගැනීමේ දී ගණනය නොකරන ලද ඡන්ද ප්‍රකාශ කර ඇති ඉතිරිව ඇති පාලකයන් විසින් අදාළ ගැලපීම් ප්‍රතිශතය ඉක්මවන පරිදි අපේක්ෂකයාගේ

මුළු ඡන්ද සංඛ්‍යාව ඉහළ දමා ඇති සේ සලකනු ලැබිය යුතු අතර එකී පාලකයන්ගේ ඡන්ද එම අපේක්ෂකයා තෝරා පත්කර ගැනීම සඳහා ගණන් නොගත යුතු ය. මෙකී ඉතිරිව ඇති පාලකයන්ට ඊළඟ ඡන්ද විමසීමේ ඡන්දය ප්‍රකාශ කළ හැකි ය.

(ඈ) කවර හෝ තදනන්තර ඡන්ද විමසීමක දී, එක් අධ්‍යක්ෂවරයකු පමණක් තෝරා පත්කර ගැනීමට ඉතිරිව ඇත්නම්, එම අධ්‍යක්ෂවරයා ඉතිරිව ඇති ඡන්ද අතරින් සුළු බහුතරයකින් තෝරා පත්කරගනු ලැබිය හැකි ය. එකී ඉතිරි සියලුම ඡන්ද අවසන් අධ්‍යක්ෂවරයා තෝරා පත්කර ගැනීම සඳහා ගණන්ගනු ලැබ ඇති සේ සලකනු ලැබිය යුතු ය.

9. *ඡන්ද පැවරීම.* - අධ්‍යක්ෂවරයකු තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමට සහභාගි නොවන හෝ ඔහුගේ ඡන්ද එම අධ්‍යක්ෂවරයා තෝරා පත්කර ගැනීම සඳහා දායක නොවූ කවර හෝ පාලකයකු විසින් ඔහුට හිමි ඡන්ද තේරීපත් වූ අධ්‍යක්ෂවරයකුට පවරාදෙනු ලැබිය හැකි ය. එසේ වුව ද, එසේ පවරා දීම සඳහා එවැනි පාලකයකු විසින් පළමුවෙන් අදාළ අධ්‍යක්ෂවරයා තෝරා පත්කර ගනු ලැබ ඇති පාලකයන්ගේ එකඟත්වය ලබාගත යුතු ය.

10. *ප්‍රාරම්භක සාමාජික වරප්‍රසාද.* - පාලකයන් විසින් අධ්‍යක්ෂවරුන් නාමයෝජනා කිරීමේ දී සහ ඡන්දය ලබාදීමේ දී සහ අධ්‍යක්ෂවරුන් විසින් විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ දී සිය ඡන්ද කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා සහ විකල්ප අධ්‍යක්ෂවරයකු ස්ථිර වශයෙන් හෝ චක්‍රීය පදනමකින් නාමෝද්දිෂ්ට කිරීමේ වරප්‍රසාදය සෑම ප්‍රාරම්භක සාමාජිකයකුට හිමිවිය යුතු ය යන ප්‍රතිපත්තිය ගරු කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.